ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

# බලපත්‍රලත් මත්පැන් නිෂ්පාදනාගාර පිළිබඳ සුරාබදු දෙපාර්තමේන්තුවේ නියාමනයේ ඇති කාර්යක්ෂමතාවය ඇගයීම.



**PUR/E/EXD/2019/PA/01**

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 1 | විධායක සාරාංශය | 4 |
| 2 | හැඳින්වීම | 7 |
| 2.1 | පසුබිම | 9 |
| 2.2 | විගණනය සඳහා අධිකාරී බලය | 10 |
| 2.3 | මාතෘකාව තෝරා ගැනීමට හේතුව | 10 |
| 2.4 | විගණන ප්‍රවේශය | 10 |
| 2.5 | විගණන අරමුණු හා නිර්ණායක | 11 |
| 2.6 | විගණන නිර්නායක | 11 |
| 2.6.1 | උප අරමුණු හා නිර්ණායක | 11 |
| 2.7 | විගණන විෂය පථය | 12 |
| 2.8 | විගණන විෂය පථය සීමාවීම | 13 |
| 3. | නිරීක්ෂණ | 13 |
| 3.1 | ආයතනික පසුබිම හා සූදානම | 13 |
| 3.1.1 | මධ්‍යසාර නිෂ්පාදනයට අදාල නෛතික ප්‍රතිපාදන | 13 |
| 3.1.2 | මධ්‍යසාර සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය | 15 |
| 3.1.3 | සුරාබදු දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය | 16 |
| 3.1.4 | මානව සම්පත් කළමනාකරණය | 16 |
| 3.2 | මධ්‍යසාර නිෂ්පාදන නියාමන කිරීමේ ආයතනික කාර්යභාරය | 17 |
| 3.2.1 | ලියාපදිංචිය | 17 |
| 3.2.2 | වගකීම පැවරීම නියාමනය හා පසුවිපරම | 17 |
| 3.3 | නිෂ්පාදන ආයතන සම්බන්ධයෙන් නියාමන කාර්ය | 19 |
| 3.3.1 | අමුද්‍රව්‍ය ලබා ගැනීම | 19 |
| 3.3.2 | ස්ප්‍රීතු ආනයනය | 20 |
| 3.3.3 | දේශීය ස්ප්‍රීතු භාවිතය | 24 |
| 3.3.4 | නිෂ්පාදනය | 26 |
| 3.3.5 | නිෂ්පාදන ප්‍රමිතිය | 31 |
| 3.3.6 | බෙදාහැරීම | 35 |
| 3.3.7 | පොත්පත් හා ගිණුම් ප්‍රකාශ පවත්වා ගැනීම | 38 |
| 3.3.8 | ගබඩා කිරීම | 40 |
| 3.3.9 | අධීක්ෂණය හා හදිසි වැටලීම් | 42 |
| 3.3.10 | නීති විරෝධී මත්ද්‍රව්‍ය (සුරා) පිළිබඳ වාර්තාවීම් | 43 |

| | | |
|---|---|---|
| 3.4 | නිෂ්පාදනය තුලින් වන සාමාජීය ආර්ථික බලපෑම | 44 |
| 3.4.1 | සෞඛ්‍ය ගැටලු | 44 |
| 3.4.2 | පවුල් සංවිධාන ගැටලු | 44 |
| 3.4.3 | රාජ්‍ය ආදායම කෙරෙහි බලපෑම | 45 |
| 3.4.4 | නීති විරෝධී පරිසරය | 45 |
| 3.4.5 | පාරිසරික බලපෑම | 45 |
| 4. | නිර්දේශ | 46 |

## බලපත්‍රලත් මත්පැන් නිෂ්පාදනාගාර පිළිබඳ සුරාබදු දෙපාර්තමේන්තුවේ නියාමනයේ ඇති කාර්යක්ෂමතාවය ඇගයීම.

### 1. විධායක සාරාංශය

1913 වර්ෂයේ ස්ථාපිත කරන ලද සුරාබදු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 52 වන අධිකාරිය වන 1912 අංක 8 දරන සුරාබදු ආඥා පනත ක්‍රියාත්මක කරනු ලබන අතර ඊට අමතරව විවිධ සංශෝධන පනත් මඟින් සංශෝධිත විධිවිධානද ක්‍රියාත්මක කරනු ලැබේ. වර්තමානය වන විට රාජ්‍ය බදු ආදායම කළමනාකරණය කරනු ලබන ආයතන අතරින් තුන්වන ස්ථානය සුරාබදු දෙපාර්තමේන්තුව හිමිකරගෙන ඇත. දෙපාර්තමේන්තුව විසින් සුරාබද්ධ සම්බන්ධ මත්පැන් නිෂ්පාදන බදු, මත්පැන් නිෂ්පාදන බදු සඳහා ප්‍රමාද ගාස්තු, ස්ප්‍රීතු ප්‍රවාහනයේදී අයකරනු ලබන බදු, බලපත්‍ර ගාස්තු, බලපත්‍ර අළුත් කිරීමේ ගාස්තු යනාදී ආදායම් එකතු කිරීම සිදුකරනු ලැබේ. සුරාබදු දෙපාර්තමේන්තුවේ පූර්ණ අධීක්ෂණය යටතේ මත්පැන් නිෂ්පාදනාගාර, ගුදම්, රා  තැබැරුම් හා විනාකිරි නිෂ්පාදනාගාර ක්‍රියාත්මක වේ. වර්තමානය වන විට මත්පැන් නිෂ්පාදනාගාර 23 ක් ස්කාගාර 14 ක් ගුදම් 8 ක් ක්‍රියාත්මක වනු ලැබේ. ස්කාගාර තුලින් ස්ප්‍රීතු නිෂ්පාදනාගාරවලට බෙදා හැරීම සිදුකරනු ලැබේ. මීට අමතරව ඇතැම් නිෂ්පාදනාගාර විසින් ස්ප්‍රීතු ආනයනය කිරීම ද සිදුකෙරේ.

දෙපාර්තමේන්තුවේ ස්ථාන මාරුවීම් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදි නිෂ්පාදනාගාර 23 ක් අතුරින් රාජ්‍ය ආදායමට ඉතා  අඩු දායකත්වයක් දක්වනු ලබන නිෂ්පාදනාගාර සමාගම් 6 ක්  ඉතා ප්‍රියමනාප ලෙස හඳුන්වා තිබීම, එම නිෂ්පාදනාගාරවල සේවයේ යෙදීමට නිලධාරීන් විශාල ප්‍රමාණයක් මනාපය දැක්වීම, එම නිෂ්පාදනාගාර සමාගම් සම්බන්ධව ගැටළු සහගත තත්ත්වයන් වාර්තා වී තිබීම, ඒවායේ කාර්මික අපරාධ වාර්තාගතවී නොතිබීම, එම ආයතන 06 නියාමනය කිරීමේ ප්‍රධාන බලධාරියා සුරාබදු දෙපාර්තමේන්තුව වීම යනාදි කාරණා මෙම මාතෘකාව තෝරාගැනීම සඳහා පාදක විය.

දේශිය ස්කාගාරවලින් හෝ ආනයනය කිරීම මඟින් නිෂ්පාදනාගාර සඳහා ස්ප්‍රීතු ලැබෙන අතර එම ස්ප්‍රීතු ලැබීම් පිළිබඳ තොරතුරු නිෂ්පාදනාගාර විසින් පවත්වාගෙන යනු ලබන ස්ප්‍රීතු ලැබීම් ලේඛණයේ (ඩී - 33) ඇතුලත් කරනු ලැබේ. මෙහිදී ස්ප්‍රීතු ප්‍රවාහනය සඳහාද බලපත්‍රයක් ලබාගත යුතු අතර ප්‍රවාහනය කරනු ලබන ස්ප්‍රීතු ලීටරයක් සඳහා රු. 10 ක ගාස්තුවක් අය කෙරේ.

නිෂ්පාදනාගාරය සඳහා ලැබෙන මෙම ස්ප්‍රීතු අදාල ලේඛණයට ඇතුලත් කිරීමෙන් පසු ඒ ඒ ලේගරවලට (VAT) නිකුත් කිරීම් සිදුකරනු ලැබේ. මෙහිදී ඒ ඒ ලේගරවලට ස්ප්‍රීතු නිකුත් කිරීම් පිළිබඳ තොරතුරු හා නිෂ්පාදනය සඳහා ස්ප්‍රීතු යෙදවීම් පිළිබඳ තොරතුරු නිෂ්පාදන කාර්යය පිළිබඳ ලේඛණයට (ඩී - 7) ඇතුලත් කිරීම සිදුකරනු ලබයි. ඒ ඒ ලේගරවලට නිකුත් කරන ප්‍රමාණය හා මාරු කිරීම් පිළිබඳව ඩී - 8 ලේඛනයට ඇතුලත් කිරීමද සිදුකෙරේ. මාසය අවසානයේදී මෙම( ඩී - 8) ලේඛණයේ එකතුව සම්පාදන ලේඛණයට (ඩී - 9) ඇතුළත් කිරීම සිදුකරයි. ඒ අනුව ස්කාගාර තුළ ස්ප්‍රීතු නිෂ්පාදනය, ප්‍රවාහනය, නිෂ්පාදනාගාරයට ලැබීම්, නිෂ්පාදනාගාරය තුළ දී ස්ප්‍රීතු ගබඩා කිරීම, නිෂ්පාදනයන් සඳහා ස්ප්‍රීතු නිකුත් කිරීම හා මධ්‍යසාර නිෂ්පාදනය කිරීම සහ වෙළඳපළට නිකුත් කිරීම පිළිබඳ සියලුම ක්‍රියාවලිය සුරාබදු නිලධාරීන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ සිදුකරනු ලැබේ. මෙහිදී ඒ ඒ ලේඛණවලට ඇතුලත් දත්ත ගැලපීමද සිදු කළ යුතු වේ. නිෂ්පාදනාගාර 6 කට අදාලව සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී එම ලේඛණ අතර නොගැලපීමේ අවස්ථා රාශියක් නිරීක්ෂණය වූයෙන් මේ සම්බන්ධව සුරාබදු නිලධාරීන්ගේ අධීක්ෂණයක් සිදුවී නොමැතිබව නිරීක්ෂණය කෙරේ. එනම් බොහෝමයක් නිෂ්පාදනාගාරවල පොත්පත්වල තොරතුරු මකා තිබීම, ටිපෙක්ස් කිරීම් හා කපා දැමීම් වැනි දෑ සිදුකර තිබූ අවස්ථාද නිරීක්ෂණය විය. නිෂ්පාදනය සඳහා භාවිතා කරන ලද ස්ප්‍රීතු ප්‍රමාණය හා සාපේක්ෂව අරක්කු නිෂ්පාදනය වාර්තා නොවීම, ලේගරවලට මාරු කිරීම් සිදුකිරීමේදී මාරු කරන ලද ප්‍රමාණය හා මාරු කරන ලද ලේගරයට ලැබීම් ප්‍රමාණය පිළිබඳව ප්‍රමාණාත්මක වෙනස්කම් පැවතීම, ස්ප්‍රීතු ප්‍රවාහනය කිරීමේ අවසර පත්‍රවල සඳහන් ප්‍රමාණය හා ලේඛණගත ප්‍රමාණය අතර විෂමතාවන් පැවතීම යනාදී නොගැලපීම් නිරීක්ෂණය වූයෙන් සුරාබදු නිලධාරීන්ගේ නියාමනය වීමක් සිදුවී ඇද්ද යන්න පිළිබඳව ගැටලු සහගත විය.

ශ්‍රී ලංකාව තුල මත්පැන් පරිභෝජනය ඉතා ඉහල මට්ටමක පැවතීම හේතුවෙන් රාජ්‍ය ආදායමට සැලකියයුතු දායකත්වයක් එමඟින් ලැබෙන බව සංඛ්‍යා දත්ත අනුව පිළිබිඹු වුවද මධ්‍යසාර භාවිතයෙන් වන අහිතු ප්‍රතිවිපාකවලට දරන වක්‍ර පිරිවැය ඊට බෙහෙවින් ඉහල අගයක් ගන්නා බව විවිධ පර්යේෂණවලින් තහවුරුවන බව වාර්තා වී ඇත.

ස්ප්‍රීතු භාවිතා කර පරිභෝජනය සඳහා නිෂ්පාදනය කරනු ලබන මත්පැන් වර්ග, වෙළඳපළට යැවීමට ප්‍රථමයෙන් නිෂ්පාදකයින් විසින් විවිධ වර්ණ කාරකයන් යෙදීම සහ රසකාරකයන් යෙදීම සිදුකරනු ලැබේ. මෙම සියළු කටයුතු සුරාබදු නියෝග ප්‍රකාරව නිෂ්පාදකයා විසින් සිදුකරනවාද යන්න පිළිබඳව සොයාබැලීමේ වගකීම සුරාබදු නිලධාරීන් සතුවේ. එක් එක් වර්ගයේ මත්පැන්

නිෂ්පාදනයේදී අනුමත ප්‍රමිතීන් යටතේ සහ සැර ප්‍රමාණයන්ට අනුව නිෂ්පාදනය සිදු කරනු ලබන බව සහ ලේබලයේ සඳහන් තොරතුරු නිවැරදි බව සොයා බැලීම සුරාබදු නිලධාරීන්ගේ වගකීම වේ. වෙන් වෙන් ලේගරවලින් ආසවනය සිදුකිරීමේදී නිදර්ශක ලබාගෙන ඒවා රජයේ රස පරීක්ෂක වෙත යවා විශ්ලේෂණ වාර්තා ලබාගෙන ඒවා නියමිත ප්‍රමිතියට අනුව තිබේද යන්න පරීක්ෂා කිරීම සිදුකෙරේ. විගණනයට භාජනය කරන ලද ස්කාගර / නිෂ්පාදනාගාර 8 ක් සම්බන්ධයෙන් නියමිත වාර ගණනකදී වාර්තා ලබා ගැනීමට කටයුතු නොකිරීම, ලබාගත් සාම්පල් ප්‍රමාද වී රස පරීක්ෂක වෙත යොමුකිරීම, රස පරීක්ෂක වාර්තාවල සඳහන් සැර ප්‍රමාණය සහ ලේබලයේ සඳහන් සැර අතර වෙනස්කම් පැවතීම යනාදී කරුණු නිරීක්ෂණය වූයෙන් සුරාබදු නිලධාරීන්ගේ වගකීම ඉටු වී ඇති බවක් නිරීක්ෂණය නොවිය.

සුරාබදු නිවේදන හා නියෝග උල්ලංඝනය සිදුකර ඇති අවස්ථා ද නිරීක්ෂණය වූයෙන් ඒ පිළිබඳව සුරාබදු නිලධාරීන්ගේ අධීක්ෂණයක් සිදුකර ඇති බවක් නිරීක්ෂණය නොවීය. තවද සුරබදු අධිකාරීන් හා සහකාර සුරාබදු කොමසාරිස්වරුන් විසින් ද ප්‍රමාණවත් අධීක්ෂණයක් සිදුකර ඇති බවක්ද නිරීක්ෂණය නොවීය.

තවද සුරාබදු නියාමන කාර්යන්ගේ නියැලි සිටින වගකිවයුතු අධිකාරීන්ගේ නොසැලකිල්ල නිසා නීති විරෝධි ලෙස දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන සුරාබදු හා රේගු බදු නොගෙවා ආනයනය කරනු ලබන ස්ප්‍රීතු භාවිතයෙන් නිෂ්පාදනය කරනු ලබන මත්පැන් සුලබව වෙළඳපොළේ සංසරණය වන බව ඉකුත් කාලපරිච්ඡේදය තුල සිදුකර ඇති පොලිස් විමර්ෂණ හා රේගු විමර්ෂණ තුලින් තහවුරු වී ඇත. එමගින් සිදුවී ඇති සමාජ හානි හා රාජ්‍ය ආදායම අහිමිවීම අවමකිරීම වගකිවයුතු අධිකාරීලත් ආයතනවල මූලික වගකීමක් වුවද මෙම විගණනය තුලින් නිරීක්ෂණය වන කරුණු හේතුවෙන් එම වගකීම ඉටුවීම ප්‍රශ්ණගත කරුණක් බව නිරීක්ෂණය කෙරේ.

ප්‍රවාහනය කිරීම සඳහා බලපත්‍ර ලබා ගැනීම, ස්ප්‍රීතු නිෂ්පාදනය, මධ්‍යසාර නිෂ්පාදනය සඳහා ස්ප්‍රීතු නිෂ්පාදනාගාරයේ ස්ප්‍රීතු ලැබීම් ලේඛනයට ඇතුළත් කිරීම සහ නිෂ්පාදන කටයුතු සඳහා ඒවා නිකුත් කිරීම දක්වා වූ ක්‍රියාවලිය පිළිබඳව සුරාබදු නිලධාරීන්ගේ අවධානය යොමු කිරීම සඳහා විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ඇති කර ගත යුතු වේ. එමෙන්ම ලේබල්, මූඩි හා බෝතල් භාවිතය පිළිබඳව මෙන්ම නිෂ්පාදිතය එම අමුද්‍රව්‍ය සමඟ ඇති සහ සම්බන්ධතාවය පිළිබඳ විශ්ලේෂණය කිරීම, දෙපාර්තමේන්තුව තුල රසායනාගාරයක් පිහිටුවීම තුලින් විශ්ලේෂණ කටයුතු පහසු කිරීමට අවශ්‍ය පියවර ගැනීම, දෙපාර්තමේන්තු නියෝග ප්‍රකාරව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගැනීම, උල්ලංගනය කිරීම්වලට අදාලව සමථ ගාස්තු නියම කිරීම, නීති විරෝධී මත්ද්‍රව්‍ය භාවිතය නිසා සෞඛ්‍ය කෙරේ අහිතකර ලෙස බලපෑම අවම කර ගැනීම සඳහා අපරාධ වැටලීම්

සිදුකර දැඩි නීතිමය පියවර ගැනීම, නිෂ්පාදනාගාරවලින් අයවිය යුතු රාජ්‍ය බදු ආදායම සුරක්ෂිත කිරීම සඳහා නිලධාරීන් විසින් මූලිකත්වය ගෙන කටයුතු කල යුතු වීම සහ විශ්ලේෂණ වාර්තා අප්‍රමාදව ලබාගැනීමට කටයුතු කිරීම යනාදි පිළියම් මෙම වාර්තාවෙන් නිර්දේශ කරණු ලැබේ.

## 2. හැඳින්වීම

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව 1913 වසරේ දී ස්ථාපිත කර ඇති අතර රාජ්‍ය බදු ආදායම කළමණාකරනය කරනු ලබන ප්‍රධාන ආයතන අතරින් එය තුන්වන ස්ථානය හිමිකරගෙන ඇත. ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 52 වන අධිකාරිය වන 1912 අංක 8 දරන සුරාබදු ආඥා පනත ක්‍රියාත්මක කරනු ලැබේ. විවිධ සංශෝධන පනත් මඟින් සංශෝධිත වූ 1999 අංක 8 දරන දුම්කොළ බදු පනත ද, විෂ වර්ග හා අබිං අන්තරායකර ඖෂධ ආඥා පනතද, 2006 අංක 27 දරන දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත යටතේ වන විධිවිධාන ද දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ සුරා හා දුම්කොළ කර්මාන්තයන්හි කාර්යක්ෂම පාලනයක් තුලින් රාජ්‍ය ආදායම එකතු කිරීමත්, එකී කර්මාන්තවල සිදුවියහැකි නීත්‍යානුකූල නොවන නිෂ්පාදනයන් වැලැක්වීම මඟින් ශ්‍රී ලංකාවේ සංවර්ධනයට හා සමාජ සුභසාධනයට දායක වීමත්, වස, විෂ, අබිං හා අන්තරායකර ඖෂධ ආඥා පනත ක්‍රියාත්මක කිරීමෙන් සමාජ ආරක්ෂාව ලබාදීමත් දෙපාර්තමේන්තුවේ මෙහෙවර වේ.

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සිය මෙහෙවර සාක්ෂාත් කරගනු පිණිස පහත දැක්වෙන පරමාර්ථයන් පෙරදැරිව කටයුතු කරනු ලැබේ.

(අ). මත්පැන් හා දුම්කොළ වලින් ලැබෙන ආදායම ආරක්ෂා කර ගැනීම.

(ආ). සුරාබදු ආඥාපනත හා දුම්කොළ බදු පනත බලාත්මක කිරීම.

(ඇ). වස, විෂ, අබිං හා අන්තරායකර ඖෂධ ආඥා පනත ක්‍රියාත්මක කිරීම.

(ඈ). දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත ක්‍රියාත්මක කිරීම.

උක්ත පරමාර්ථයන් මුදුන් පත් කර ගැනීම පිණිස ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව පහත දැක්වෙන ක්‍රියාකාරකම්වල නියැලෙයි.

(අ). සුරාබදු ආදායම එකතු කිරීම.

(ආ). මත්පැන් නිෂ්පාදනාගාර බලපත්‍ර නිකුත් කිරීම.

(ඇ). රා තැබෑරුම්, ස්කාගාර, විනාකිරි නිෂ්පාදනාගාර සහ බෝතල් කිරීමේ මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය රා ලබාගැනීම පිණිස රා මැදීම සහ ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම.

(ඈ). ස්කාගාර , ගුදම් සහ මත්පැන් නිෂ්පාදනාගාර පාලනය සහ අධීක්ෂණය කිරීම.

(ඉ). බලපත්‍රලත් ස්ථාන අධීක්ෂණය හා පාලනය.

(ඊ). ප්‍රාදේශීය ලේකම්වරුන්ට රා තැබෑරුම් සහ රට බීම තැබෑරුම් වාර්ෂිකව වෙන්දේසි කිරීම පිණිස අවශ්‍ය අවම තක්සේරු මිල ගණන් ලබා දීම.

(උ). බලපත්‍රධාරීන් විසින් සිදු කරනු ලබන වරදවල් සුරාබදු ආඥාපනතේ සඳහන් විධිවිධානයන්ට යටත්ව සමථයකට පත් කිරීම.

(ඌ). සුරාබදු ආඥාපනත යටතේ බලපත්‍රයකින් තොරව සිදු කරනු ලබන සියළුම නීති විරෝධී කටයුතු ග්‍රහණය කර වැරදිකරුවන් අධිකරණය හමුවට ඉදිරිපත් කිරීම.

(එ). වස, විෂ, අබිං සහ අන්තරාධායක ඖෂධ ආඥා පනත යටතේ සිදු කරනු ලබන සියලුම නීති විරෝධී කටයුතු ග්‍රහණය කර වැරදිකරුවන් අධිකරණය හමුවට ඉදිරිපත් කිරීම.

(ඒ). දුම්කොළ බදු පනත යටතේ නිෂ්පාදනය කරනු ලබන අනුමත නිෂ්පාදනයන් අධීක්ෂණය හා දුම්කොළ බදු ආදායම් එකතු කර ගැනීම සහ ආරක්ෂා කර ගැනීම.

## 2.1 පසුබිම

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා යටතේ පාලනය වේ. සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල පරිපාලනය සඳහා පළාත් පදනම යටතේ සුරාබදු කොට්ඨාශ වලට බෙදා ඇති අතර බස්නාහිර පළාත කොට්ඨාශ 3කට ද වයඹ පළාත කොට්ඨාශ 2 කට ද දිස්ත්‍රික් පදනම මත බෙදා ඇත. මෙම සුරාබදු කොට්ඨාශ සහකාර සුරාබදු කොමසාරිස්වරුන් විසින් අධීක්ෂණය කරනු ලබයි. සුරාබදු කොට්ඨාශ යටතේ සුරාබදු අධිකාරී කාර්යාල ස්ථාපිත කර ඇති අතර සුරාබදු අධිකාරී කාර්යාල යටතේ සුරාබදු ස්ථාන පිහිටුවා ඇත. දෙපාර්තමේන්තුව විසින් සීමානිර්ණය කරන ලද සුරාබදු බල ප්‍රදේශ යටතේ ඒවා පාලනය කෙරේ. මෙම සුරාබදු ස්ථාන සඳහා පරීක්ෂක ශ්‍රේණීන්ට හා සෙසු නිලයන්ට අයත් නිලධාරීන් අනුයුක්ත කර ඇත. එම නිලධාරීන් අතරින් පරීක්ෂක ශ්‍රේණීන්ට අයත් ජ්‍යේෂ්ඨතම නිලධාරියා සුරාබදු ස්ථානාධිපති ලෙස කටයුතු කෙරේ. ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යාලයකින්, දිවයින පුරා පිහිටි සහකාර සුරාබදු කොමසාරිස් කාර්යාල 13 කින්, සුරාබදු අධිකාරී කාර්යාල 30 කින්, සුරාබදු ස්ථාන 56 කින් සහ විශේෂ මෙහෙයුම් ඒකක 5 කින් සිය මෙහෙවර ඉටුකරගනු ලැබේ.

සුරාබදු දෙපාර්තමේන්තුව විසින් සුරාබද්ධ හා සම්බන්ධ මත්පැන් නිෂ්පාදන බදු, මත්පැන් නිෂ්පාදන බදු සඳහා ප්‍රමාද ගාස්තු, දේශීය සහ ආනයනික ස්ප්‍රීතු මිලදීගැනීම් මත බදු, බලපත්‍ර ගාස්තු, අයදුම්පත්‍ර ගාස්තු, බලපත්‍ර අළුත් කිරීම්, බලපත්‍ර පැවරුම් ගාස්තු, නම් වෙනස්කිරීම් සහ රා එකතු කිරීමේ මධ්‍යස්ථාන ගාස්තු යනාදී ගාස්තු එකතු කිරීම සිදු කරනු ලැබේ. මීට අමතරව දුම්කොළ බදු ද එකතු කරනු ලැබේ.

සුරාබදු දෙපාර්තමේන්තුවේ පූර්ණ අධීක්ෂණය යටතේ මත්පැන් නිෂ්පාදනාගාර, ගුදම්, රා තැබැරුම් හා විනාකිරි නිෂ්පාදනාගාර ක්‍රියාත්මක වේ. මත්පැන් නිෂ්පාදනාගාර තුල දේශීය මත්පැන් (අරක්කු), දේශීයව නිෂ්පාදිත විදේශ මත්පැන්, වයින්, සකේ, බෝතල් රා හා බීර යනාදිය නිෂ්පාදනය කරනු ලබයි. මෙයින් අරක්කු හා විදේශ මත්පැන් සැර මත්පැන් ලෙසද රා, වයින්, සකේ, බියර් මෘදු මත්පැන් ලෙසද සලකනු ලැබේ.

ස්කාගාර තුල ඊතයිල් ස්ප්‍රීතු, පරිපාක ස්ප්‍රීතු, පොල් ස්ප්‍රීතු හා තල් ස්ප්‍රීතු නිෂ්පාදනය කරනු ලබයි. පොල් රා හා තල් රා මූලය වශයෙන් ගෙන පොල් හා තල් ස්ප්‍රීතු ආසවනය කරනු ලබන අතර සීනි නිෂ්පාදනයේ අතුරු ඵලයක් වන මොලැසස් වලින් සෙවනගල හා පැලවත්ත ස්කාගාර තුල පරිපාක ස්ප්‍රීතු නිපදවනු ලැබේ. තවද බඩ ඉරිඟු පිෂ්ඨය උපයෝගී කර සකේ නිෂ්පාදනය කිරීමේ අතුරුඵලය

මූලය ලෙස ගනිමින් පරිපාක ස්ප්‍රීතු නිපදවනු ලැබේ. ඊට අමතරව මත්පැන් නිෂ්පාදනයට සහ කාර්මික නිෂ්පාදන සඳහා ඊතයිල් ස්ප්‍රීතු ආනයනය කිරීමද සිදු කෙරේ.

වර්තමානය වන විට ශ්‍රී ලංකාව තුල මත්පැන් නිෂ්පාදනාගාර 23 ක්ද ස්කාගාර 14 ක්ද ගුදම් 8 ක් ද ස්ථාපනය කර ඇත. සුරාබද්දු කොමසාරිස් ජනරාල් හා නියෝජ්‍ය සුරාබද්දු කොමසාරිස්ගේ (ආදායම් හා බලපත්‍ර) අධීක්ෂණය යටතේ බලපත්‍ර අංශය තුල මත්පැන් බදු ආදායම් ගණනය කිරීමත් ඊට අදාල පරිගණක දත්ත මෙහෙයවීමත් හා මත්පැන් නිෂ්පාදනාගාර, ගුදම් හා ස්කාගාර වලට අදාල වාර්තා, දත්ත, ලේඛණ පවත්වාගෙන යාමත් සිදුවේ.

## 2.2 විගණනය සඳහා අධිකාරි බලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (154) (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන හා 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 2.3 මාතෘකාව තෝරා ගැනීමට හේතුව

නිෂ්පාදනාගාර 23 ක් අතුරින් රාජ්‍ය ආදායමට ඉතා අඩු දායකත්වයක් දක්වනු ලබන නිෂ්පාදනාගාර සමාගම් 6 ක් තුල පිහිටුවා ඇති සුරාබදු කාර්යාල මෙම දෙපාර්තමේන්තුවේ ස්ථාන මාරුවීම් ප්‍රතිපත්ති ප්‍රකාරව ඉතා ප්‍රියමනාප ස්ථාන ලෙස හඳුන්වා තිබුණි. තවද ඒවායේ සේවයේ යෙදීමට නිලධාරීන් ඉහල මනාපයක් දක්වා ඇති බව ස්ථාන මාරුවීම් සඳහා ලැබෙන ඉල්ලීම් පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය විය. එසේ වුවද එම නිෂ්පාදනාගාර සමාගම් සම්බන්ධයෙන් බොහෝ ගැටළු සහගත තත්ත්වයන් වාර්තා වී තිබීමත්, අනෙකුත් නිෂ්පාදනාගාර හා සැසඳීමේදී මෙම නිෂ්පාදනාගාරවල දුර්වලතා පිළිබඳව සුරාබදු නිලධාරීන්ගෙන් ප්‍රමාණවත් දෝෂයන් වාර්තා නොවීමත් සහ එම නිෂ්පාදනාගාර නියාමනය කිරීමේ ප්‍රධාන බලධාරියාද සුරාබදු දෙපාර්තමේන්තුව වීමත් යන කාරණා මෙම මාතෘකාව තෝරා ගැනීමට පාදක විය.

## 2.4 විගණන ප්‍රවේශය

දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර ඇති මූලාශ්‍ර පරීක්ෂාව

(අ). නිෂ්පාදනාගාර , ස්කාගාර,ගුදම් භෞතික පරීක්ෂාව.

(ආ). නිෂ්පාදනාගාර / ස්කාගාර වල පවත්වාගෙන යනු ලබන ගිණුම් පොත්පත් පරීක්ෂාව.

(ඇ). ප්‍රධාන කාර්යාලයේ ඇති බලපත්‍ර ලිපිගොනු සහ වාර්තා පරීක්ෂා කිරීම.

(ඇ). ආනයනය කිරීම සම්බන්ධයෙන් රේගු අංශයෙන් තොරතුරු ලබාගැනීම.

(ඉ). ස්ප්‍රීතු ආනයනය සම්බන්ධයෙන් ආනයනය අපනයනය පාලන දෙපාර්තමේන්තුවෙන් තොරතුරු ලබාගැනීම.

(ඊ). නිෂ්පාදිතයන් සම්බන්ධයෙන් නියමිත ප්‍රමිතීන්ට අනුව නිෂ්පාදනයකර ඇති බව සනාථ කෙරෙන රසපරීක්ෂක වාර්තා ලබාගැනීම.

(උ). අපද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳ නියමිත ක්‍රමවේදයන් අනුගමනය කරන්නේද යන්න පරීක්ෂා කිරීම.

## 2.5 විගණන අරමුණු හා නිර්ණායක

52 වන අධිකරිය වු සුරාබදු ආඥා පනතේ 25 වන වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 2 වන ඡේදය සමඟ කියවිය යුතු සුරාබදු ආඥාපනතේ 32 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන රීති ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් කටයුතු කල යුතු වේ. ඒ අනුව අංක 844 හා 902 දරණ සුරාබදු නිවේදන, මාර්ගෝපදේශ සහ දෙපාර්තමේන්තුවේ ශිල්පීය නියෝග අදාල කරගතයුතු වේ. නිෂ්පාදනාගාර, ස්කාගාර සහ ගුදම් සම්බන්ධයෙන් ඉහත සඳහන් සුරාබදු නිවේදනවල උපදෙස් සහ දෙපාර්තමේන්තුවේ ශිල්පීය නියෝග උල්ලංගනය කර ඇද්ද යන්න පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් නිසි අධීක්ෂණයක් සහ නියාමනයක් සිදුවේද යන්න පිළිබඳ පරීක්ෂා කිරීම මෙම විගණනයේ අරමුණු විය.

## 2.6 විගණන නිර්නායක

### 2.6.1 උප අරමුණු හා නිර්නායක

| උප අරමුණු | | නිර්නායක |
|---|---|---|
| (i) | මිනිස් පරිභෝජනයට සුදුසු මධ්‍යසාර නිපදවේ ද යන්න | දෙපාර්තමේන්තු ශිල්පීය නියෝග හා ප්‍රමිත |
| (ii) | දෙපාර්තමේන්තුව විසින් නියාමනය කිරීමක් සිදුකරනවාද යන්න | සුරාබදු නිවේදන, පනත්, චක්‍රලේඛ, දෙපාර්තමේන්තු නියෝග, ශිල්පීය නියෝග |
| (iii) | සුරාබදු නිවේදන අංක 844 හි උපදෙස් පිළිපැද ඇතිද යන්න | නිෂ්පාදනාගාර / ස්කාගාර ස්ථාපිත කිරීමට හා පවත්වාගෙනයාමට අදාල කොන්දේසි |

| | | |
|---|---|---|
| (iv) | දෙපාර්තමේන්තුවේ ශිල්පීය නියෝග පිළිපැද ඇතිද යන්න | ශිල්පීය නියෝග ක්‍රියාත්මක කිරීමේ පරිපාටි |
| (v) | අභ්‍යන්තර පාලනය | පවත්වා ඇති පාලන ක්‍රමවේද |
| (vi) | බදු ගණනය කිරීම නිවැරදිව සිදු කෙරේද | සුරාබදු නිවේදන වලට අනුකූල වීම |

## 2.7 විගණන විෂය පථය

**2.7.1** මෙම විගණනය, විගණන කටයුතු පිළිබඳ උත්තරීතර ආයතනවල අන්තර්ජාතික ආයතනය (ඉන්ටොසායි) විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන් සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයන් සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව සිදු කරනු ලැබේ. අපගේ විගණනයේ නිරීක්ෂණයන් හා නිර්දේශයන් මත නිගමනයකට එළඹීම සඳහා ඉහත සඳහන් කරන ලද අරමුණු කොතරම් දුරකට ළඟාකර ගත හැකිද යන්න හා එම අරමුණු ළඟාකර ගැනීම හා සම්බන්ධ අවදානම් මොනවද යන්න හඳුනාගැනීම සඳහා පදනමක් ලෙස ආයතනය සහ එහි මෙහෙයුම් කටයුතු සහ අභ්‍යන්තර පාලන ක්‍රම පිළිබඳව අප විසින් අවබෝධයක් ලබා ගැනීම අපේක්ෂා කෙරේ.

**2.7.2** අපගේ විගණන කාර්යයන් පූර්වයෙන් සැලසුම් කොට ඇති විගණන සැලසුමට සම්බන්ධ කොට තිබේ. විගණනය සඳහා පවත්නා කාල වේලාවන් සහ මානව සම්පත් මත මෙම විගණනයේ ප්‍රමාණය නියැදි පටිපාටීන්ට පමණක් සීමා කරනු ලැබේ.

**2.7.3** බස්නාහිර පළාත තුල ස්ථාපිතව ඇති නිෂ්පාදනාගාර, ස්කාගාර හා ගුදම්වල කටයුතු පිළිබඳ පරික්ෂා කිරීම මෙන්ම සුරාබදු දෙපාර්තමේන්තුවේ ස්ථාන මාරුවීම් ක්‍රියා පරිපාටියේ ඉතා ප්‍රියමනාප ස්ථාන ලෙස හඳුන්වා දී ඇති ආයතනවලින් ලැබෙන සුරාබදු ආදායම මුළු සුරාබදු ආදායමෙන් ඉතා කුඩා ප්‍රතිශතයක්ව පැවතීම හා එයට බලපාන හේතු පරීක්ෂා කිරීමට මෙම විමර්ශනය සීමා කෙරේ.

## 2.8 විගණන විෂය පථය සීමාවීම

මත්පැන් නිෂ්පාදනාගාර සියල්ලක්ම සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති ආයතන නිසා තෙවන පාර්ශවයෙන් තොරතුරු ලබා ගැනීමේදී අපහසුතාවයන්ට ලක් වීම, විශේෂයෙන් සමාගම් විසින් නිෂ්පාදනාගාරය තුල ඇති කර ඇති අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් පිළිබඳව සහ ඒවායේ ගබඩා කිරීම්, අලෙවිය පිළිබඳ තොරතුරු ලබාගැනීමේ අපහසුතාවය, ස්ප්‍රීතු ආනයනය කිරීමට අදාලව රේගු තොරතුරු ලබා ගැනීමේ අපහසුතාවය යන කරුණු විගණන විෂයපථය සීමා වීම කෙරේ බලපාන ලදී.

## 3 නිරීක්ෂණ

## 3.1 ආයතනික පසුබිම හා සූදානම

### 3.1.1 මධ්‍යසාර නිෂ්පාදනයට අදාල නෛතික ප්‍රතිපාදන

(52 වන අධිකාරිය) වු සුරාබදු ආඥා පනතේ 25 වන වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (2) වන ඡේදය සමඟ කියවිය යුතු, සුරාබදු ආඥා පනතේ 32 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන රීතී ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් කටයුතු කළ යුතු වේ. ඒ අනුව අංක 844 දරණ සුරාබදු නිවේදනය, ස්කාගාර මාර්ගෝපදේශ සුරාබදු නිවේදනය හා අංක 902 දෙපාර්තමේන්තුවේ ශිල්පීය නියෝග අදාල කරගත යුතු වේ.

අධීක්ෂණයට ලක් කරන ලද නිෂ්පාදනාගාර, ස්කාගාර, සහ ගුදම් සම්බන්ධයෙන් ඉහත සඳහන් සුරාබදු නිවේදන සහ දෙපාර්තමේන්තුවේ ශිල්පීය නියෝගවලට අනුකූලව කටයුතු කර නොමැති අවස්ථා පහත පරිදි නිරීක්ෂණය විය.

**3.1.1.1** දෙපාර්තමේන්තුවේ ශිල්පීය නියෝග ප්‍රකාරව ගිණුම් පොත්වල වැරදි නිවැරදි කිරීම අවශ්‍ය වු විට වැරදි සටහන උඩින් සිහින් රතු ඉරක් ඇඳ එම ඉරට උඩින් නිවැරදි සටහන ලිවීමෙන් නිවැරදි කිරීම් කර සෑම නිවැරදි කිරීමක්ම නිවැරදි කිරීම් කල නිලධාරියා කෙටි අත්සන යොදා දිනය දැමිය යුතුය. එසේම ඩී - 7, ඩී -8 , ඩී - 9 යන ලේඛණ සම්බන්ධයෙන් නිලධාරියා ලියවිල්ලකින් ඉල්ලුම් කරන පරිදි ස්කාගාර නිලධාරයා විසින් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා විසින්ද කෙටි අත්සන යෙදිය යුතුය. සිදු කරන ලද නියැදි පරීක්ෂාවට අනුව ස්කාගාර  සහ නිෂ්පාදනාගාර විසින් මෙම ශිල්පීය නියෝග කඩකර තිබුණි. එම නිෂ්පාදනාගාරවල ගිණුම් පොත්පත් හා පවත්වාගෙන යනු ලබන ලේඛණ ටිපෙක්ස් කිරීම හා මැකීම් සිදුකර තිබු අතර ඒවායේ කෙටි අත්සන සහ දිනය

යෙදීමටද කටයුතු කර නොතිබීම තුලින් අක්‍රමිකතා සිදු වීමට ඉඩකඩ පැවති බවත් ඒ පිළිබඳව අධීක්ෂණ නිලධාරීන්ගේ අවධානය යොමු වී නැති බවත් නිරීක්ෂණය විය.

**3.1.1.2** අංක 844 දරන සුරාබදු නිවේදනයේ 7 ඡේදය ප්‍රකාරව ඉබියතුරු සවිකිරීම සඳහා සුරාබදු කොමසාරිස් ජනරාල් සෑහීමකට පත්වන අයුරින් සියළුම සලාංග , ස්ප්‍රීතු ග්‍රාහක , ලේගර සඳහා සුදුසු සහ සුරක්ෂිත ඇමිණීම්, සැපයීම් සහ නඩත්තු කිරීම සිදුකල යුතු විය. එහෙත් හංවැල්ල ඇක්මී නිෂ්පාදනාගාරයේ ලේගර කාමර දෙකෙහිම ලේගරවලට ඉබියතුරු දමා නොමැති බවත් එක් ලේගර කාමරයක් තුළ මධ්‍යසාර මිශ්‍ර කිරීම, නිෂ්පාදනය කිරීම යනාදි කටයුතු සිදුවන බැවින් ලේගර කාමරය විවෘතව තැබීමට සිදුවන බවත් නිරීක්ෂණය වීය. ඒ අනුව සුරාබදු නිවේදන ප්‍රකාරව කටයුතු නොකිරිම හේතුවෙන් අක්‍රමිකතා සිදුවීමට ඉඩකඩ පැවති බව නිරීක්ෂණය විය.

**3.1.1.3** සුරාබදු නිවේදන 335 (25) D කොන්දේසිය ප්‍රකාරව පොල් ස්ප්‍රීතු ආශ්‍රිතව නිපදවනු ලබන මත්පැන් සඳහා යොදාගත යුතු මධ්‍යසාර ප්‍රතිශතය සියයට 74.1 ක් වූ උපරිම සීමාවට යටත් වේ. එහෙත් එම සැර ඉක්මවා ස්ප්‍රීතු ආසවනය කිරීමේදී රොක්ලන්ඩ් ස්කාගාරය විසින් සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ පූර්ව අනුමැතිය ලබාගෙන ඇති බවක් විගණනයට නිරීක්ෂණය නොවීය.

**3.1.1.4** බලපත්‍රයක් ලබාගනු ලබන යම් කිසි තැනැත්තකු විසින් දෙපාර්තමේන්වේ රීති ප්‍රකාරව ඒ ඒ බලපත්‍ර වර්ගය අනුව නිශ්චිතව දක්වා ඇති ගාස්තුව හා බදු ගෙවිය යුතුවේ. සුරාබදු ආඥා පනතේ 25 වගන්තිය සහ 32 වන වගන්තිය ප්‍රකාරව රීති සම්පාදනය කිරීමේදී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සුරාබදු දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබාගෙන නොතිබූ අතර මිල උච්චාවචනයන් පිළිබඳව සැලකිල්ලක් නොදක්වා ගාස්තු නොවෙනස්ව තැබීම හා පහත දැමීම තුලින් රාජ්‍ය ආදායමට සිදුවන අහිතකර බලපෑම පිළිබඳව නොසලකා හැරිම විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය. දෙපාර්තමේන්තුව විසින් 2008, 2015 සහ 2017 වර්ෂවලදී පිළිවෙලින් සුරාබදු නිවේදන අංක 902, 983 සහ 1004 දරන රීති ප්‍රකාරව ගාස්තු නියම කිරීම පිළිබඳ විස්තර ඇමුණුම 01 හි දැක්වේ.

**3.1.1.5** දෙපාර්තමේන්තු නියෝග 1 කොටසේ IV වන පරිච්ඡේදයේ 2.3 කිසියම් කටයුත්තක් සඳහා ප්‍රයෝජනයට ගෙන නොමැති ලේගර හෝ ප්‍රතිග්‍රාහක වල ගබඩා කර ඇති මධ්‍යසාර දෙසතියකට වරක් ආමානය කිරීම හා සම්මත කිරීම සිදුකොට එහි ප්‍රතිඵල සම්මත ගණන් හා මිමි තැබීමේ ලේඛණයේ (ඩී-6) සඳහන් කල යුතු වුවත් රෝයල් කාස්ක් ස්කාගාරයේ සුරාබදු නිලධාරීන් විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**3.1.1.6** සුරාබදු නිවේදන 335(25)D කොන්දේසිය ප්‍රකාරව පොල් ස්ප්‍රීතු ආශ්‍රිතව නිපදවනු ලබන මත්පැන් සඳහා යොදාගත යුතු මධ්‍යසාර ප්‍රතිශතය සියයට 74.1 ක් වූ උපරිම සීමාවට යටත්වේ. එහෙත් එම මධ්‍යසාර සැර ඉක්මවා සියයට 74.9 සිට සියයට 79 දක්වා ප්‍රතිශතයකින් ස්ප්‍රීතු ආසවනය කර ඇති බව ඩී.සී.එස්.එල්. නව ගුදමට අදාල ඩී-33 ලේඛනය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

**3.1.1.7** පැසවුම්කරණයෙන් ලබාගන්නා එතිල් මධ්‍යසාරවල මධ්‍යසාර ප්‍රතිශතය විවිධ අවස්ථා වලදී නිර්ණය කිරීම සඳහා ප්‍රමිත කරන ලද උපකරණ කට්ටලයක් සුරාබදු ස්ථානය තුල තිබීම අනිවාර්ය වුවද රෝයල් කාස්ක් නිෂ්පාදනාගාරය තුල එවැනි උපකරණ කට්ටලයක් නොතිබුණි. මධ්‍යසාර සැර ප්‍රමාණය මත සුරාබදු ආදායම තීරණය වන අතර ඒ අනුව නිවැරදි සුරාබදු ආදායම ගණනය කෙරේද යන්න සහ ප්‍රමිතියෙන් යුතු මධ්‍යසාර නිෂ්පාදනයක් සිදුවේද යන්න පිළිබඳව විගණනයේදී මතභේදයට ලක් විය.

### 3.1.2 මධ්‍යසාර සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය

රටතුළ මත්ද්‍රව්‍ය නීති විරෝධීව නිෂ්පාදනය කර, ප්‍රවාහනය කිරීම බහුලව සිදු වේ. ඒවායේ දුර්විපාක ලෙස සෞඛ්‍ය කෙරෙහි මත්ද්‍රව්‍ය නිසා සිදුවන අහිතකර බලපෑම් වන මත්ද්‍රව්‍ය සම්බන්ධ අපරාධවල වර්ධනය හා මත්පැන් මඟින් විනාශ වී යන මානව, ස්වාභාවික හා මූල්‍ය සම්පත් මෙන්ම මත්ද්‍රව්‍ය දුර්භාවිතය හේතුකොටගෙන සිදුවන පුද්ගල - පවුල් සහ විවිධ ජනකොටස්වල විනාශය, වීථි මට්ටමින් මත්ද්‍රව්‍ය පවතින ප්‍රමාණය ඉහලයාමේ වර්ධනයක් දක්නට ලැබීම යන කාරණා දැක්විය හැක. තවද මෙම කරුණු හේතුවෙන් මත්ද්‍රව්‍ය නීතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමුඛ ආයතනයක් ලෙස සුරාබදු දෙපාර්තමේන්තුවට කටයුතු කිරීමට නීතිමය ප්‍රතිපාදන සලසා තිබේ. එම නිසා මධ්‍යසාර සම්බන්ධ ජාතික ප්‍රතිපත්තියක් සැකසීමේ අවශ්‍යතාවය වඩාත් තීව්‍ර වන අතර එමගින් පුළුල් සමතුලිත හා සම්බන්ධීකරණය වූ උපාය මාර්ගයන් තුලින් සැපයුම් පාලනය කිරීම හා ඉල්ලුම අඩුකිරීමත්, මත්ද්‍රව්‍ය පාලන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමෙහි නිරත රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශය, වෙනත් සංවිධාන විසින් එක් එක් උපාය මාර්ග යටතේ නිශ්චිත ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ මත ක්‍රියාකිරීමේ අවශ්‍යතාවය කෙරේ අවධානය යොමු කලයුතු බවත් නිරීක්ෂණය කෙරේ.

සියලුම මධ්‍යසාර නිෂ්පාදන වර්ග අලෙවි කිරීම් සඳහා බලපත්‍ර ලබාදීමේදී මහජනයාගේ සෞඛ්‍ය, ආරක්ෂාව හා මහජන මතය වැනි සාධක මත පදනම් වූ විනිවිදභාවයෙන් යුතු නව ක්‍රමවේදයක අවශ්‍යතාවයද නිරීක්ෂණය කෙරේ.

### 3.1.3 සුරාබදු දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය

සුරාබදු කොමසාරිස් ජනරාල් යටතේ ආදායම් ප්‍රතිපත්ති හා පරිපාලන කටයුතු සඳහා අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල්වරයෙකු (පරිපාලන සේවය) සහ ආදායම් මෙහෙයුම් හා නීති ක්‍රියාත්මක කිරීම් සඳහා අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල්වරයෙකු වශයෙන් දෙදෙනකු සිටිනු ලබන අතර එම අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල්වරු යටතේ සුරාබදු කොමසාරිස්වරු 4 දෙනෙක්ද සුරාබදු කොමසාරිස්වරුන් යටතේ නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්වරු 9 ක්ද වේ. දෙපාර්තමේන්තුගත නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්වරුන් යටතට සහකාර සුරාබදු කොමසාරිස්වරුන් සහ අනෙකුත් නිලධාරීන් අයත්වේ. (විස්තර ඇමුණුම-02)

### 3.1.4 මානව සම්පත් කළමනාකරණය

(අ) 2019 ජුනි 30 දින වන විට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 1,492 ක් වූ අතර එදිනට සත්‍ය කාර්ය මණ්ඩලය 1,299 ක්ද පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 193 ක් ද පැවතුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ සුරාබදු කොමසාරිස් ජනරාල් තනතුර 2019 මාර්තු 07 දින සිට පුරප්පාඩුව පවතින අතර ඒ සඳහා එදින සිට 2020 අගෝස්තු මස වන විටත් වැඩ බැලීමේ පත්වීම් ලබා දී තිබුණි. ප්‍රධාන ආදායම් ලබන දෙපාර්තමේන්තුවක ගණන් දීමේ නිලධාරී තනතුර සම්පූර්ණ කර නොතිබීම පිළිබඳ විගණනයේදී ගැටළු සහගත විය.

(ඇ) විගණනයේදී පරීක්ෂාවට ලක් කරන ලද නිෂ්පාදනාගාර අතරින් වී.ඒ. නිෂ්පාදනාගාරය සහ ඇක්මී නිෂ්පාදනාගාරය සඳහා අනුමත සුරාබදු පරීක්ෂක නිලධාරී සංඛ්‍යාව එක් අයෙකු බැගින් විය. එසේ වුවද වී.ඒ. නිෂ්පාදනාගාරය සඳහා සුරාබදු පරීක්ෂකවරු තිදෙනෙක්ද අනුයුක්ත කර තිබුණි. එසේ වුවද එම නිෂ්පාදනාගාරවලින් සුරාබදු ආදායමට දායකත්වය පිළිවෙලින් සියයට 1.63 ක් සහ සියයට 3.54 ක අඩු අගයක් ගෙන තිබුණි. (2018 වර්ෂයේ සුරාබදු ආදායම අනුව)

## 3.2 මධ්‍යසාර නිෂ්පාදන නියාමන කිරීමේ ආයතනික කාර්යභාරය

### 3.2.1 ලියාපදිංචිය

සුරාබදු ආඥා පනත යටතේ බලපත්‍රයක් ලබාගනු ලබන සෑම තැනැත්තකු විසින්ම ආඥා පනත මඟින් නියම කර ඇති පරිදි තම බලපත්‍රයේ කාල සීමාව ආවරණය කිරීම සඳහා ගිවිසුමක් ලියා අත්සන් කලයුතු අතර තමා ඉල්ලුම් කරන අදාල බලපත්‍ර වර්ගය සඳහා නිශ්චිතව දක්වා ඇති ඇපයක් ඉදිරිපත් කල යුතුවේ.

අළුත් බලපත්‍රයක් නිකුත් කිරීමේදී පළාත් පාලන බලධාරීන් විසින් සහතික කරන ලද යෝජිත ගොඩනැගිල්ලේ පිඹුරෙහි ඡායාස්ථ පිටපතක්, අයිතිය පිළිබඳ සහතික කරන ලද ඔප්පු පිටපතක්, ඉල්ලුම්කරු පසුගිය වසර 5 ක කාලය තුලදී දණ්ඩ නීති සංග්‍රහය යටතේ වරදකරුවකු වී නොමැති බවට දිවුරුම් ප්‍රකාශයක්, අදාල බල ප්‍රදේශයේ සිට ළඟම ඇති පාසල් හා පූජනීය ස්ථානවලට දුර ප්‍රමාණයන් දක්වන බලයලත් මිනින්දෝරුවකුගෙන් ලබාගත් මිනින්දෝරු සැලැස්මක්, ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයක් හා සමාගමක් සම්බන්ධයෙන් නම් ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු මඟින් සහතික කල සමාගම් ලියාපදිංචිය පිළිබඳ සහතිකයේ ඡායා පිටපතක් යනාදී ලියකිවිලි ඉදිරිපත් කල යුතු වේ. තවද ප්‍රතිපූර්ණය නොකරනු ලබන ඉල්ලුම්පත්‍ර ගාස්තුවක්ද ගෙවිය යුතු වේ.

### 3.2.2. වගකීම් පැවරීම නියාමනය හා පසුවිපරම්

ශ්‍රී ලංකාව තුල පිහිටා ඇති ස්කාගාර, ගුදම්, අරක්කු නිෂ්පාදනාගාර, ධාන්‍ය මත්පැන් නිෂ්පාදනාගාර සහ බෝතල් රා නිෂ්පාදනාගාර සහ බලපත්‍රලත් සියළුම ස්ථාන අධීක්ෂණය පාලනය හා නියාමන කටයුතු සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීහු අනුයුක්ත කර තිබේ. එම නිලධාරින් විසින් සුරා කර්මාන්තයෙහි කාර්යක්ෂම පාලනයක් ඇති කිරිම තුලින් සුරාබද්ධ පිළිබඳ ගණන් තැබීම, වාර්තා කිරීම, සුරාබදු එකතු කිරීම, බන්ධිත තොග මෙහෙයුම් කටයුතු වල යෙදීම, රජයේ අධීක්ෂණය යටතේ නිෂ්පාදනය වන මත්පැන්වල තත්ත්ව පාලනය සම්බන්ධව අධීක්ෂණය කිරීම හා පරිපාලනයේ නියාමන කටයුතු සිදුකිරීම යනාදි කාර්යයන් ඉටුකල යුතුවේ. එම නිලධාරීන් විසින් සියළු මත්පැන් නිෂ්පාදනාගාරයන්හි සුරාබද්ධට යටත් සියළු ද්‍රව්‍යයන් භාරව සිටීම මෙන්ම නිෂ්පාදනයට අදාල සියළු පියවරයන් දෛනිකව හා තත්ත්කාලීනව අධීක්ෂණය කිරීම ද කල යුතු වේ. නිෂ්පාදනාගාර ක්‍රියාකාරී තත්ත්වයේ පවතින සෑම අවස්ථාවකදීම එම නිෂ්පාදනාගාරයන්ට අනුයුක්තව සිටින සුරාබදු නිලධාරීන් පහත රාජකාරි කටයුතු පිළිබඳවද නියාමනයක් කල යුතු වේ.

(අ) මූලද්‍රව්‍ය අවස්ථාවේ පටන් නිමි ද්‍රව්‍ය අවස්ථාව දක්වා වූ නිෂ්පාදන සැපයුම් දාමයේ එක් එක් සහ සෑම අවස්ථාවක්ම අධීක්ෂණය කිරීම.

(ආ) නිෂ්පාදනාගාරයට ලැබෙන අමුද්‍රව්‍යවල, අඩ නිමි ද්‍රව්‍යවල හා නිමි ද්‍රව්‍යවල තත්ත්ව පාලනය සඳහා නියමිත මූලික පරීක්ෂණ සිදුකිරීම හා විශ්ලේෂණ වාර්තා කැඳවීම, ප්‍රමාණාත්මක හා ගුණාත්මක ගණනය කිරීම් අධීක්ෂණය කිරීම.

(ඇ) නිෂ්පාදනාගාරයන්හි සියළුම ගිණුම් ලේඛන ගත කිරීම හා පවත්වා ගැනීම, ඒවායේ දත්තයන් දෛනිකව, මාසිකව, ත්‍රෛමාසිකව, අර්ධ වාර්ෂිකව හා වාර්ෂිකව පරීක්ෂා කිරීම, විශ්ලේෂණය කිරීම හා වාර්තා කිරීම.

(ඇ) මත්පැන් නිෂ්පාදනාගාරයන් නියමිත ප්‍රමිතියෙන් පවත්වාගෙනයාම සඳහා ඒවායේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම හා වාර්තා කිරීම.

(ඉ) රාජ්‍ය ආදායම සුරාබදු වශයෙන් එකතු කිරීම පහසු කිරීම පිණිස නිවැරදි ලෙස භෞතික තොග පවත්වා ගැනීම.

(ඊ) සමස්ත නිෂ්පාදන ක්‍රියාවලියම ආවරනය වන පරිදි මත්පැන් ලැබෙන, ගබඩා කරනු ලබන, භාරගනු ලබන හා නිකුත් කරනු ලබන සෑම අවස්ථාවකදීම ඒවා පරීක්ෂා කිරීම සහ අධීක්ෂණය කිරීම.

(උ) සමස්ථ නිෂ්පාදන ක්‍රියාවලියම ආවරණය වන පරිදි විවිධ අවස්ථාවන්හිදී මත්පැන් නිදර්ශක ලබාගෙන රජයේ රස පරීක්ෂක වෙත යවා විශ්ලේෂණ වාර්තා ලබා ගැනීම.

(ඌ) මහජන පරිභෝජනයට සුදුසුවනසේ හා සුරාබදු සම්බන්ධ දේශීය හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව මත්පැන් නිෂ්පාදනය සිදුවන බවට වග බලා ගැනීම.

(එ) බන්ධිත මෙහෙයුම්වලදී අදාල බදු ගෙවීම් පිළිබඳ ලේඛණ පවත්වා ගැනීම, ගමන් වාර සඳහා ප්‍රවාහන අවසර පත් ලබාදීම, මෙහෙයුම්වලට අදාල ජාලගත සන්නිවේදනයන් පවත්වා ගැනීම ඒ පිළිබඳ ලේඛණ පවත්වා ගැනීම හා වාර්තා කිරීම.

එහෙත් ඉහත සඳහන් රාජකාරි කටයුතු ඉටුකිරීම සඳහා නිෂ්පාදනාගාර සහ ස්කගාරවලට නිලධාරීන් අනුයුක්ත කිරීමේදී අසාමාන්‍ය තත්ත්වයක් පැවති බව නිරීක්ෂණය විය. ඒ අනුව ආදායම් ලැබීම් අතින් සියයට 0.3 ක් සියයට 3.5 ත් අතර ඉතා අඩු මට්ටමක පැවති නිෂ්පාදනාගාර සහ ස්කාගාර සඳහා අනුමතව

පැවති කාර්ය මණ්ඩලයද ඉක්මවා සේවකයින් සේවයේ යොදවා තිබුණි. එවැනි අවස්ථා සඳහා උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

| නිෂ්පාදනාගාර / ස්කාගාර | තනතුර | අනුමත සංඛ්‍යාව | තත්ත්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| ---------------------------- | --------- | ---------- | ---------- |
| ඇක්මී ලංකා නිෂ්පාදනාගාරය | සුරාබදු පරීක්ෂක | 01 | 03 |
| | සුරාබදු සැරයන් මේජර් | - | 02 |
| රෝයල් කාස්ක් ස්කාගාරය | ප්‍රධාන සුරාබදු පරීක්ෂක | - | 02 |
| මෙන්ඩිස් /මොරගල්ල | සුරාබදු නියාමක | 02 | 04 |
| ඒෂියා පැසිපික් බෲවරි | සුරාබදු පරීක්ෂක | 01 | 02 |
| නවයාලතැන්න ගුදම | සුරාබදු පරීක්ෂක | 01 | 02 |

## 3.3. නිෂ්පාදන ආයතන සම්බන්ධයෙන් නියාමන කාර්ය

### 3.3.1. අමුද්‍රව්‍ය ලබාගැනීම

ස්කාගාර තුල පරිපාක ස්ප්‍රීතු නිෂ්පාදනය කරනු ලබන අතර එම පරිපාක ස්ප්‍රීතු පොල් ස්ප්‍රීතු හා තල් ස්ප්‍රීතු වශයෙන් වර්ග කෙරේ. පොල් හා තල් රා මූලය වශයෙන් ගෙන පොල් හා තල් ස්ප්‍රීතු ආසවනය කරනු ලබන අතර, සීනි නිෂ්පාදනයේ අතුරු ඵලයක් වන මොලෑසස්වලින් සෙවනගල හා පැලවත්ත ස්කාගාර තුලද පරිපාක ස්ප්‍රීතු නිපදවනු ලැබේ. තවද, බඩ ඉරිඟු පිෂ්ඨය හා සකේ නිෂ්පාදනයේ අතුරු ඵලයද මූලය වශයෙන් ගෙන පරිපාක ස්ප්‍රීතු නිපදවනු ලැබේ. ඊට අමතරව ඊතයිල් ස්ප්‍රීතු ආනයනය කිරීමද සිදුකරනු ලැබේ.

මධ්‍යසාර නිෂ්පාදනය සඳහා යොදාගනු ලබන අමුද්‍රව්‍ය මූලද්‍රව්‍ය අවස්ථාවේ සිට නිමි ද්‍රව්‍ය අවස්ථාව දක්වා වූ නිෂ්පාදන දාමය සෑම අවස්ථාවකම සුරාබදු නිලධාරීන් විසින් අධීක්ෂණය සිදුකල යුතුවේ. එසේම නිෂ්පාදනාගාරවලට / ස්කාගාරවලට ලැබෙන අමුද්‍රව්‍යවල, අඩ නිමි ද්‍රව්‍යවල හා නිමි ද්‍රව්‍ය වල තත්ත්ව පාලනය සඳහා නියමිත මූලික පරීක්ෂණ සිදුකිරීම මෙන්ම විශ්ලේෂණ වාර්ථා කැදවීමද සුරාබදු නිලධාරීන් විසින් සිදුකලයුතු වේ.

බලපත්‍රලත් මත්පැන් නිෂ්පාදනාගාර 23 ක් ක්‍රියාත්මක වනු ලබන අතර මෙම නිෂ්පාදනාගාර විසින් මධ්‍යසාර නිෂ්පාදනය සඳහා අවශ්‍ය ස්ප්‍රීතු ලබාගැනීම ක්‍රම කිහිපයක් මඟින් සිදුකෙරේ. එනම් ස්ප්‍රීතු ආනයනය කිරීම, දේශීයව මිලදීගැනීම සහ දේශීය නිෂ්පාදනය කර ගැනීමෙනි.

**3.3.2. ස්ප්‍රීතු ආනයනය**

**3.3.2.1** 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ස්ප්‍රීතු ආනයනය කිරීම පිළිබඳ විස්තර පහත පරිදි විය.

| වර්ෂය | ආනයනය කරන ලද ස්ප්‍රීතු ප්‍රමාණය. |
|---|---|
| | තොග ලීටර |
| 2019 | 15,295,344.0 |
| 2018 | 13,444,881.0 |
| 2017 | 18,195,430.4 |
| 2016 | 18,431,571.3 |

**3.3.2.2** ඊතයිල් මධ්‍යසාර ආනයනය කිරීමේදී බලපත්‍රධාරියා විසින් කරනු ලබන ඉල්ලීම මත නාමමාත්‍ර ඉන්වොයිසියේ සඳහන් තොග ප්‍රමාණය සඳහා ආනයන අවසර පත්‍රයක් නිකුත් කරනු ලබයි. නියමිත තොග රේගුවට ලැබීමෙන් පසු රේගුව විසින් බලපත්‍රධාරින්ට නිකුත් කරනු ලබන ලිපිය සුරාබදු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු රේගු ලේඛනවල සඳහන් තොග ප්‍රමාණය සඳහා සුරාබදු නිවේදන 988 ප්‍රකාරව ප්‍රවාහන බදු අයකරනු ලැබේ. බදු අයකිරීමෙන් පසු ස්ප්‍රීතු තොගය බලපත්‍රලත් ස්ථානයට බාරගන්නා අවස්ථාවේදි සුරාබදු නිලධාරීන් විසින් භෞතික තොග ශේෂය පිළිබඳ ගණනය කිරීමක් සිදුකරනු ලබයි. එහිදි ප්‍රවාහන පත්‍රයේ සඳහන් ප්‍රමාණය ඉක්මවා ලැබී ඇති ස්ප්‍රීතු සම්බන්ධයෙන් බදු අයකිරීමටද කටයුතු කරනු ලැබේ. 2019 සැප්තැම්බර් 30 දිනට ආනයනික සමාගම් 2 ක් විසින් ඇනවුමේ සඳහන් ස්ප්‍රීතු තොගය ඉක්මවා තොග ලීටර් 3,760,319.53 ක් ආනයනය කර තිබුණි. සමාගම් තුනකට අදාලව රේගු දෙපාර්තමේන්තුවේ දත්ත අනුව සහ ආනයනික ප්‍රමාණය අතර තොග ලීටර් 4,553,811.7 ක ප්‍රමාණාත්මක වෙනසක් නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි විය.

| සමාගමේ නම | ඇනවුම් කළ ප්‍රමාණය (2019.9.30 දිනට) | ආනයනය කරන ලද ප්‍රමාණය (2019.9.30 දිනට) | රේගු දත්ත අනුව ආනයනය (2019.9.30 දිනට) |
|---|---|---|---|
| | තොග ලීටර | තොග ලීටර | තොග ලීටර |
| අයි. ඩී. එල්. සමාගම | 318,967.00 | 268,815.00 | 322,919.30 |
| ඩී.සී.එස්.එල්. සමාගම | 8,485,986.00 | 11,953,005.00 | 7,790,171.00 |
| පෙරිසිල් සමාගම | 677,149.47 | 970,450.00 | 525,368.00 |
| | 9,482,102.47 | 13,192,270.00 | 8,638,458.30 |

ඉහත සඳහන් පරිදි වූ ප්‍රමාණාත්මක වෙනස්කම් පැවතීම හේතුවෙන් ස්ප්‍රීතු ආනයනය කිරීමේදී සුරාබදු දෙපාර්තමේන්තුව, ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව සහ රේගු දෙපාර්තමේන්තුව යන ආයතන විසින් එම කටයුතු නිසිපරිදි නියාමයක් සිදුකරන්නේද යන්න විගණනයේදී බරපතල ලෙස මතභේදයට ලක් විය.

**3.3.2.3** ඩී.සී.එස්.එල්. සමාගම විසින් පැරණි ගුදම සඳහා විවිධ රටවලින් ස්ප්‍රීතු ආනයනය කර තිබූ අතර එම ආනයන ස්ප්‍රීතු ගුදම වෙත ප්‍රවාහනය කල ප්‍රමාණය සහ සත්‍ය වශයෙන් ගුදම වෙත ලැබී ඇති ප්‍රමාණය (ඩී-33 අනුව) අතර පහත පරිදි වෙනස්කම් නිරීක්ෂණය විය.

| වර්ෂය හා මාසය | ඩී-28 අනුව ස්ප්‍රීතු ප්‍රමාණය | ඩී-33 අනුව ස්ප්‍රීතු ප්‍රමාණය | වෙනස |
|---|---|---|---|
| | සං.ම.ලී. | සං.ම.ලී. | සං.ම.ලී. |
| 2020 ජුලි දක්වා | 165,480.2 | 166,087.2 | 607.0 |
| 2019 | 1,945,356.7 | 1,954,611.5 | 9,254.8 |
| 2018 | 2,329,413.8 | 2,343,205.2 | 13,791.4 |

උක්ත සඳහන් වෙනස්කම් වලට අදාලව නියමිත සුරාබද්ධ හා රේගු බදු මුදල් අයකර ඇද්ද යන්න පිළිබඳව විගණනයට සනාථ කිරීම් ඉදිරිපත් නොවූ අතර සමාගම වෙත ස්ප්‍රීතු වැඩිපුර ආනයනය කිරීමට ඉඩ සලසා දීම තුලින් ස්ප්‍රීතු ආනයනය කිරීමේදී දූස්සන්ධානයන් ඇතිවීමට ඇති ඉඩකඩ සැලසී ඇති බවට වන සැකය විගණනයේදී බැහැර කල නොහැකි විය.

**3.3.2.4** ඩී.සී.එස්.එල් පැරණි ගුදම සඳහා 2019 දෙසැම්බර් මස දකුණු අප්‍රිකාවෙන් ගෙන්වන ලද පරිපාක ස්ප්‍රීතු සං.ම.ලී 13578.7 ක් ඩී-33 ලේඛනයට ඇතුලත්ව නොතිබුණි. ඒ අනුව එම ආනයනික ස්ප්‍රීතු තොගයට අදාල මධ්‍යසාර නිෂ්පාදනය සම්බන්ධයෙන් රාජ්‍ය ආදායම අහිමි වී ඇත්ද යන සැකය විගණනයේදී බැහැර කළ නොහැකි විය.

**3.3.2.5** අයි. ඩී. එල්. නිෂ්පාදනාගාරයේ ස්ප්‍රීතු ආනයනයට අදාල ප්‍රවාහන බලපත්‍ර වල (ඩී - 28) සඳහන් ස්ප්‍රීතු ප්‍රමාණය සං.ම.ලී. 320,474.1 ක් වූ අතර සත්‍ය වශයෙන් ලැබීම් පිළිබඳ සටහන් කරණු ලබන ලේඛනයේ (ඩී-33) සඳහන් ස්ප්‍රීතු ප්‍රමාණය සං.ම.ලී. 323,317.6 වූයෙන් සං.ම.ලී. 2,843.5 ක වෙනසක් නිරීක්ෂණය විය.

**3.3.2.6** ඩී.සී.එස්.එල් නව ගුදම සඳහා 2020 ජනවාරි 13 දිනැති අංක D330947 දරන ප්‍රවාහන අවසර පත්‍රය අනුව ඕස්ට්‍රේලියාවෙන් ආනයනය කරන ලද පරිපාක ස්ප්‍රීතු තොග ලීටර් 13,054 ක් (සංශුද්ධ මධ්‍යසාර ලීටර් 12,584.1 ක්) ඩී-33 ලේඛනයේ ලේගර අංක 38 ට මාරු කළ බවට සඳහන් කර තිබුණද ඩී-8 ලේඛනයේ ලේගර අංක 38 ට ලැබීම් ලෙස සඳහන් කර නොතිබුණි. ඒ අනුව එම ස්ප්‍රීතු භාවිතා කර සිදුකරන ලද මධ්‍යසාර නිෂ්පාදනයන්ට අදාලව බදු මුදල් අයවී ඇද්ද යන්න විගණනයේදී ප්‍රශ්ණගත කරුණක් විය.

**3.3.2.7** ඩී.සී.එස්.එල් නව ගුදම 2020 මාර්තු 13 දින අංක D/286523 දරන ප්‍රවාහන අවසර පත්‍රය අනුව පකිස්ථානයෙන් ගෙන්වන ලද පරිපාක ස්ප්‍රීතු තොග ලීටර් 6,807 (සංශුද්ධ මධ්‍යසාර ලීටර් 6,542.3 ක්) කුමන ලේගරයට නිකුත් කලාද යන්න D-33 ලේඛනයේ සඳහන් කර නොතිබුණි. ඒ අනුව එම ස්ප්‍රීතු භාවිතා කර නිෂ්පාදනය කරන ලද මධ්‍යසාර සම්බන්ධයෙන් නියමිත බදු මුදල් අය වී ඇත්ද යන්න සහ පවත්වාගෙන යනු ලබන ගිණුම් පොත්වල නිවැරදිතාවය පිළිබඳව ද ප්‍රශ්නගත කරුණක් විය.

ස්ප්‍රීතු ආනයනය කිරීම සහ ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් ඉහත සඳහන් පරිදි වූ ප්‍රමාණාත්මක වෙනස්කම් පැවතීම හේතුවෙන් සුරාබදු දෙපාර්තමේන්තුව විසින් එම කටයුතු නිසි පරිදි නියාමනයක් සිදු කරන්නේ ද යන්න විගණනයේදි බරපතල ලෙස මතභේදයට තුඩුදෙන කරුණක් විය.

**3.3.2.8** වර්ෂයකට අවශ්‍යවන ඊතයිල් මධ්‍යසාර ප්‍රමාණය පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් නිෂ්චිත හඳුනාගැනීමක් සිදුකර නොතිබු අතර වැඩිපුර ආනයනය සම්බන්ධයෙන් දඩ මුදලක් පැනවීමට අවශ්‍ය නීති රීති සම්පාදනය කිරීමටද කටයුතු කර නොතිබුණි. ඒ අනුව අයදුම්කරන ප්‍රමාණයට අතිරේකව වැඩිපුර ආනයනය කිරීමට ඉඩ සලසා දී තිබෙන බව නිරීක්ෂණය කෙරේ.

**3.3.2.9** නීති විරෝධි ලෙස ස්පිතු ආනයනය කිරීම, භාවිතා කිරීම සම්බන්ධයෙන් පහත පරිදි වාර්තා වීම් සිදුවිය.

(අ) හිඟුරාන නිෂ්පාදනාගාරය විසින් 2012, 2013 සහ 2014 වර්ෂ වලදී නීතී විරෝධි ලෙස ආනයනය කල එතනෝල් ස්ප්‍රීතු ලීටර් 518,600 ක් භාවිතා කිරීම සම්බන්ධයෙන් රේගු දෙපාර්තමේන්තුව සිදුකල පරීක්ෂණයට අනුව සමාගමේ අධ්‍යක්ෂ ඇතුලු තිදෙනෙකුගෙන් රු.270,000,000 ක දඩ මුදලක් අයකර ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් සුරාබදු දෙපාර්තමේන්තුව විසින් සිදුකරණ ලද පරීක්ෂණයට අනුව සුරාබදු මුදල ලෙස රු.588,900,344 ක් අයකර ගෙන තිබුණි.

(ආ) හිඟුරාණ ඩිස්ටලරීන් සමාගමට අයත් ස්කාගාරයේ 2015 මැයි 21 දින සුරාබදු නිළධාරීන්ගේ පරීක්ෂණයට අනුව නීතී විරෝධි ලෙස භාවිතා කළ පරිපාක ස්ප්‍රීතු ලීටර් 19,440ක් වෙනුවෙන් රු.50,620,739 ක සුරාබද්ධක් අය කිරීමට තීරණය කර තිබූ අතර එම මුදල 2018 වර්ෂය වන විටත් අයකර නොතිබුණි. ඒ සම්බන්ධයෙන් විගණන විමසුමක් නිකුත් කිරීමෙන් පසු 2019 වර්ෂයේදී එම මුදලින් රු.40,072,443 ක් අය කර තිබූ අතර 2020 ජුලි මස වනවිටත් තවදුරටත් අයවීමට තිබූ මුදල රු.10,548,295 ක් විය.

(ඇ) ගලගෙදර රෝයල් කාස්ක් ඩිස්ටිලරීස් පෞද්ගලික සමාගම විසින් 2019 වර්ෂයේදී නීතී විරෝධි ලෙස  මෝල්ට් ස්ප්‍රීතු තොග ලීටර් 5000 ක් ආනයනය කර තිබුණි. බලපත්‍ර රහිතව ආනයනය කර තිබූ ස්ප්‍රීතු තොගය සඳහා රු.500,000 ක සමථ ගාස්තුවක් අයකර ඒ සඳහා ස්ප්‍රීතු ආනයන බලපත්‍රයක් නිකුත් කර අදාල ස්ප්‍රීතු තොගය වෙනත් ආයතනයක් වෙත කිසිදු පරීක්ෂණයකින් තොරව නිෂ්පාදකයන්ට අවශ්‍ය  ආකාරයට හුවමාරු  කර ගැනීමට පහසුකම් සලසා තිබුණි. මේ අනුව සුරා බද්ධ සම්බන්ධයෙන් සුරාබදු ආඥා පනත බලාත්මක කල යුතු නියාමන ආයතනයක නියාමන ක්‍රියාවලිය නිසි පරිදි ඉටු වූයේද යන්න .විගණනයේදී ගැටලු සහගත විය

### 3.3.3 දේශීය ස්ප්‍රීතු භාවිතය

**3.3.3.1** 2019 ජනවාරි සිට සැප්තැම්බර් 30 දක්වා කාලය තුල, ප්‍රවාහන බලපත්‍ර අනුව ඇක්මී නිෂ්පාදනාගාරය සඳහා ස්ප්‍රීතු ලැබීම් ප්‍රමාණය, සම්පාදන ලේඛණයේ (ඞී-9) සඳහන් ස්ප්‍රීතු ලැබීම් අතර ලීටර් 7,650 ක වෙනසක් නිරීක්ෂණය විය.

**3.3.3.2** ස්කාගාරයකට / නිෂ්පාදනාගාරයකට ස්ප්‍රීතු ලබා ගැනීමේදී හෝ නිකුත් කිරීමේදී ප්‍රවාහන බලපත්‍රයක් (ඞී - 28 ) ලබාගත යුතු අතර එම බලපත්‍රය මඟින් ප්‍රවාහනය කරනු ලබන ස්ප්‍රීතු සම්බන්ධයෙන් අදාල ස්කාගාරය / නිෂ්පාදනාගාරය විසින් එම ස්ප්‍රීතු ලද බවට සනාථ කර ගැනීම සටහන් කර ගත යුතුවේ. ප්‍රවාහන අවසර පත්‍රයේ සඳහන් ස්ප්‍රීතු ප්‍රමාණය සහ ඞී - 33 සනාථ කිරීම් ලේඛණයේ සඳහන් ප්‍රමාණයන් අතර නොගැලපීම් තිබුණි. හිඟුරාන නිෂ්පාදනාගාරයේ 2019 ජනවාරි සිට සැප්තැම්බර් 30 දක්වා කාලපරිච්ඡේදය තුලදී ඞී - 33 ලේඛණය අනුව පොල් ස්ප්‍රීතු තොග ලීටර 10,267.4 ක් ලැබී තිබූ අතර ඞී - 28 ප්‍රවාහන ලේඛණයට අනුව එය තොග ලීටර 11,993.5 ක් විය. ඒ අනුවද බදු ආදායම සුරක්ෂිත කිරිම සඳහා ස්ප්‍රීතු ප්‍රවාහනය සම්බන්ධව හඳුන්වා දි ඇති අභ්‍යන්තර පාලන ක්‍රම සතුටුදායක මට්ටමකින් ක්‍රියාත්මක නොකරන බව නිරීක්ෂණය විය.

**3.3.3.3** ඒ ඒ නිෂ්පාදනාගාර විසින් මත්පැන් නිෂ්පාදනය සඳහා අවශ්‍ය බෝතල්, මූඩි, ලේබල් පිළිබඳව මිලදී ගැනීම් සහ භාවිතා කල ප්‍රමාණය කොපමණද යන්න පිළිබඳ අධීක්ෂණයක් ස්ථාන භාර සුරාබදු නිලධාරීන් විසින් සිදුකරනු ලබන බවක් නිරීක්ෂණය නොවීය. ඒ අනුව නිෂ්පාදනය කරනු ලබන මත්පැන් ප්‍රමාණය, බෙදා හරිනු ලබන මත්පැන් ප්‍රමාණය, අලෙවි කරනු ලබන මත්පැන් ප්‍රමාණය හා බදු අයකරනු ලබන මත්පැන් ප්‍රමාණය යනාදි පියවරයන් එකිනෙකට ගැලපේද යන්න පිළිබඳ සොයාබැලීම සඳහා වූ සතුටුදායක අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය කෙරේ.

**3.3.3.4** පොල් ස්ප්‍රීතු නිෂ්පාදනය සඳහා අවශ්‍ය රා ලබාගැනීම පිළිබඳ විගණනයේදී පරීක්ෂණයට ලක්කරන ලද දුම්මලසූරිය ඇක්මී ස්කාගාරය සඳහා රා සැපයීම වෙනුවෙන් සැපයුම්කරුවන්ගේ ලේඛණය අනුව සැපයුම්කරුවන් තිදෙනෙකු ලියාපදිංචි වී සිටි අතර රා මැදීම සඳහා ලකුණු කරන ලද පොල් ගස් ගණනෙහි එකතුව 12,000 ක් විය. ඒ අනුව සැපයිය යුතු උපරිම රා ප්‍රමාණය තොග ලීටර 18,000 ක් (දිනකට) විය. මෙහිදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රා එකතු කිරීමේ මධ්‍යස්ථානවලට අදාල අනුමත පොල් ගස්වලින් සැපයිය යුතු උපරිම රා ප්‍රමාණයෙන් සියයට 98 කට ආසන්න ප්‍රමාණයක් දෛනිකව සැපයීම සිදුකෙරෙන බවට දෛනික රා ලැබීම් ලේඛණය අනුව වාර්තාවීම ප්‍රශ්ණගත කරුණක් විය.

(ආ) රා සැපයුම් ලේඛණය පරීක්ෂා කිරිමේදි නිරීක්ෂණය වුයේ 2019 මාර්තු මාසයේ සිට බලපත්‍ර දෙකක පොල්ගස් 5,075 කට අදාල සැපයුම්කරුවන් දෙදෙනකු විසින් රා සැපයීම නතර කර ඇති බවයි. ඒ අනුව 2019 මාර්තු මස සිට අනුමත පොල් ගස් ගණන 6925 ක් වුවද සුරාබදු ඩී - 7 ලේඛණය අනුව ලකුණු කර ඇති ගස් ගණන 11,330 ක් ලෙසද මදින ලද ගස් ගණන 6255 ක් ලෙසද සඳහන් කර තිබුණි. ඒ අනුව සුරාබදු ආදායම සුරක්ෂිත කිරීම සඳහා යොදා ඇති අභ්‍යන්තර පාලන විධිවිධානවල ප්‍රායෝගික වැදගත්කම ගැන වගකිවයුතු පාර්ශවයන්ගේ අවධානය යොමු කර ඇති බවක් නිරීක්ෂණය නොවීය.

(ඇ) 2018 වසර සහ 2019 සැප්තැම්බර් මාසය දක්වා කාලය තුල කොන්ත්‍රාත්කරුවන් විසින් රා නොසැපයීම සම්බන්ධයෙන් සුරාබදු ස්ථානය දැනුවත් කර ඇති බවක් නිරීක්ෂණය නොවු අතර රා නොසැපයීමට අදාල හේතු පරීක්ෂා කිරීමට ස්කාගාර භාර නිලධාරීයා විසින්ද කටයුතු කර ඇති බවක් විගණනයට නිරීක්ෂණය නොවීය. ඒ අනුව සුරාබදු ආදායම සුරක්ෂිත කිරිම හා කාර්මික අපරාධ අවම කිරිම සඳහා සැලකියයුතු දායකත්වයක් අදාල කාර්යාල විසින් සිදුකර ඇති බවක් නිරීක්ෂණය නොවීය.

**3.3.3.5** රෝයල් කාස්ක් ස්කාගාරයේ ස්ප්‍රීතු නිෂ්පාදනය සඳහා පිටි භාවිතය ඩී-7 ලේඛනය අනුව සහ භාවිතා කරන ලද බඩ ඉරිඟු පිෂ්ඨය සම්බන්ධ ලේඛනයේ සඳහන් තොරතුරු එකිනෙකට නොසැසඳුනු අවස්ථා පහත පරිදි නිරීක්ෂණය විය.

| වර්ෂය | ඩී-7 ලේඛනය අනුව පිටි භාවිතය | අමුද්‍රව්‍ය ලේඛනය අනුව පිටි භාවිතය | වෙනස |
|---|---|---|---|
| | මෙ.ටොන් | මෙ.ටොන් | මෙ.ටොන් |
| 2019 | 1052.82 | 840.71 | 212.11 |
| 2020 ජුනි දක්වා | 3341.39 | 3178.1 | 163.29 |

**3.3.3.6** ඒ ඒ නිෂ්පාදිතයන් සඳහා ලේබල් අනුමත කරවා ගැනීම පිළිබඳව ලේබල්වල සඳහන් විය යුතු කරුණු පිළිබඳව සුරාබදු නිවේදන සකසා ඇතත් ඒ ඒ නිෂ්පාදනාගාර විසින් භාවිතයට ගැනීමට අපේක්ෂිත ලේබල ප්‍රමාණය, භාවිතා කර ඇති ප්‍රමාණය හා විනාශ වී ඇති ප්‍රමාණය යනාදි කරුනු පිළිබඳව අවධානයක් යොමු කර නොතිබීම හේතුවෙන් රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරිම සඳහා මනා අධීක්ෂණයක් සුරාබදු නිලධාරීන් විසින් සිදුකර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

### 3.3.4 නිෂ්පාදනය

සුරාබදු දෙපාර්තමේන්තුව යටතේ මත්පැන් නිෂ්පාදනාගාර 18 ක් (බලපත්‍ර ලත් නිෂ්පාදනාගාර 23 කි.) ක්‍රියාත්මකවනු ලබන අතර එම නිෂ්පාදනාගාර විසින් 2018 වර්ෂයට අදාලව වාර්ෂිකව නිපදවනු ලබන මධ්‍යසාර නිෂ්පාදනයන් හා එමඟින් ආදායමට වන දායකත්වය පිළිබඳ තොරතුරු ඇමුණුම 03 හි දැක්වේ. ඒ අනුව මුළු මත්පැන් නිෂ්පාදනය හා එක් එක් නිෂ්පාදන සමාගමේ වෙළඳපල කොටස පිළිබඳව පරික්ෂාවේදී නිරීක්ෂණය වුයේ සැර මත්පැන් නිෂ්පාදන සමාගම් 19 ක් ක්‍රියාත්මක තත්වයේ පැවතියද මුලු ආදායමින් සියයට 83.71 ක දායකත්වයක් ලබා දී තිබුණේ සමාගම් 3 ක් විසින් පමණක් බවයි. නිෂ්පාදන සමාගම් 4 ක දායකත්වය සියයට 2 ත් 3 ත් අතර වූ ඉතා අඩු මට්ටමක පැවතුණු අතර අනෙක් සමාගම්හි දායකත්වයද සියයට 22 ටත් වඩා අඩු මට්ටමක පැවතුණි. ඒ අනුව නිෂ්පාදනය අඩු සමාගම් සම්බන්ධයෙන් අවධානය යොමුකර එම අසාමාන්‍ය තත්ත්වයන් පිළිබඳව සුරාබදු නිලධාරීන් විසින් කරුණු සොයාබලා රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරිම සඳහා පියවර ගෙන ඇති බවක් නිරීක්ෂණය නොවුණි.

**3.3.4.1** ඉකුත් වර්ෂ කිහිපයක නිෂ්පාදනාගාර විසින් භාවිතා කර ඇති පොල්, තල්, පරිපාක ස්ප්‍රීතු ප්‍රමාණය, එමගින් නිෂ්පාදනය කර ඇති මධ්‍යසාර ප්‍රමාණය හා පරිභෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ෂය | භාවිතා කර ඇති ස්ප්‍රීතු ප්‍රමාණය (දේශිය හා ආනයන) | මධ්‍යසාර නිෂ්පාදනය |
|---|---|---|
| | සං.ම.ලී | සං.ම.ලී |
| 2016 | 34,550,864.97 | 31,685,768.52 |
| 2017 | 46,211,046.97 | 28,490,312.10 |
| 2018 | 26,761,437.76 | 25,221,252.70 |

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වාර්ෂිකව ස්ප්‍රීතු භාවිතා කිරීමට සාපේක්ෂව වාර්ෂිකව නිෂ්පාදනයේ ප්‍රමාණාත්මක උච්චාවචනයක් දක්නට ලැබෙන හෙයින්, ස්ප්‍රීතු භාවිතය හා නිෂ්පාදනය අතර සහසම්බන්ධතාවක් නොමැති බව නිරීක්ෂණය විය. දෙපාර්තමේන්තුවේ ඉහළ කළමනාකරණය හෝ ප්‍රාදේශීය සුරාබදු කාර්යාලවල නිලධාරීන් විසින් මෙම කරුණු පිළිබඳව ගැඹුරින් සොයා බැලීමක් සිදුකර සුරාබදු ආදායම සුරක්ෂිත කර ඇති බවත් නිරීක්ෂණය නොවීය. මධ්‍යසාර නිෂ්පාදනය මත සුරාබදු අයකරනු ලබන හෙයින් භාවිතාකර ඇති ස්ප්‍රීතු ප්‍රමාණයට සාපේක්ෂකව මධ්‍යසාර නිෂ්පාදනයේ ප්‍රමාණාත්මක අඩුවීමක් දක්නට ලැබිම මතභේදයට තුඩුදෙන කරුණක් විය.

(ආ) ස්ප්‍රීතු ආනයනය කිරීම, දේශිය ස්ප්‍රීතු නිෂ්පාදනයකිරීම සහ මත්පැන් නිෂ්පාදනය යන කරුණු ගැන සළකා බැලීමේදී සීමා රහිත ස්ප්‍රීතු ප්‍රමාණයක් රටතුළ සංසරණය වන බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) වාර්ෂිකව නිෂ්පාදනයේ අඩුවීමක් දක්නට ලැබුනද පහත සදහන් දත්ත අනුව මධ්‍යසාර පරිභෝජනය ඉහල අගයක් ගැනීම පිළිබදව ගැටළු සහගත තත්ත්වයක් පෙන්නුම් කෙරුණි. මෙම අසාමාන්‍ය තත්ත්වයන් පිළිබඳ ගැඹුරින් විමර්ශනය කර ඒ තුලින් ඇතිවිය හැකි අහිතකර තත්ත්වයන් පිළිබඳ වගකිව යුතු පාර්ශවයන් විසින් සුදුසු පිලියම් යෙදීමට කටයුතු කර ඇති බවක් නිරීක්ෂණය නොවීය.

| වර්ෂය | පරිභෝජනය |
|---|---|
| ---------- | ---------------- |
| | ලීටර් |
| 2016 | 191,100,412.58 |
| 2017 | 184,879,442.29 |
| 2018 | 224,976,196.65 |

**3.3.4.2** වෙල්ගම, තිත්තපත්තර පිහිටි රොක්ලන්ඩ් ඩිස්ටිලරීස් (පුද්) සමාගමේ මෙහෙයුම් කළමණාකරුගේ 2019 පෙබරවාරි 21 දිනැති ලිපිය හා නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (ආදායම්)ගේ 2019 මැයි 02 දිනැති අංක ඊඩී/04/01/09 – VII දරන ලිපිය ප්‍රකාරව 2018 මාර්තු 07 සිට 2018 අප්‍රේල් 09 දක්වා වු කාල සීමාව තුල නිෂ්පාදනය කරන ලද ත්‍රී ස්ටාර් බ්ලැක් ලේබල්

වර්ගයේ අරක්කු ලීටර 11,884.875 ක තොග ප්‍රමාණයක් අවක්ශේප අංශු සහිත මත්පැන් දෝෂ සහිත ලෙස බෝතල් ගත කිරිම පිළිබඳව වාර්තා වි තිබුණි. එහෙත් අදාල කාල පරාසය තුල ලීටර 74,601 ක අරක්කු නිෂ්පාදනය කර ඇති බව විගණන පරික්ෂාවේදී නිරීක්ෂණය විය. ඒ අනුව මෙසේ දෝෂ සහිතව නිෂ්පාදනය කර තිබූ මුළු අරක්කු තොගයෙන් මේ වන විට ලීටර 62,716.125 ක් වෙළඳපොළට නිකුත් කිරීමෙන් පසුව නැවත ගබඩාවට රැස්කර ගෙන නොතිබූ අතර ඒ අනුව එම ප්‍රමාණය පොදු මහජනයා විසින් පරිභෝජනය කර ඇති බව නිරික්ෂණය විය. සුරාබදු දෙපාර්තමේන්තුවේ පූර්ණ අධීක්ෂණය හා නියාමනය යටතේ මෙසේ දෝෂ සහිතව අරක්කු නිෂ්පාදනය සිදු කර වෙළඳපොළට නිකුත් කිරීම පිළිබඳව විගණනයේ දී බරපතල ලෙස මතභේදයට තුඩුදෙන කරුණක් විය. ඒ අනුව මත්පැන්වල ප්‍රමිතිය පිළිබඳවද අදාල නිලධාරීන්ගේ අධීක්ෂණය ඉතාම දුර්වල මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

**3.3.4.3** V.A. නිෂ්පාදනාගාරයේ 2017 වර්ෂයේදී අරක්කු නිෂ්පාදනය සඳහා නිකුත් කල ස්ප්‍රීතු ප්‍රමාණය නිරපේක්ෂ මධ්‍යසාර ලීටර් 564,406.06 ක් සහ බෝතල් කරන ලද අරක්කු නිෂ්පාදනය නිරපේක්ෂ මධ්‍යසාර ලීටර් 568,566.87 ක් වූයෙන් නි.ම.ලි. 4,160 ක ප්‍රමාණාත්මක වෙනසක් නිරීක්ෂණය විය. මෙම විචලතාවයන් පිළිබඳව සොයා බලා ඉන් රාජ්‍ය ආදායමට සිදුවන බලපෑම කෙරෙහි නිලධාරින්ගේ අවධානයක් යොමු වි ඇති බවක් නිරික්ෂණය නොවිය.

**3.3.4.4** නිෂ්පාදන කාර්ය පිළිබඳ (ඩී - 7) ලේඛණය පරීක්ෂාවේදී හිඟුරාන ස්කාගාරය (කොරාඹේ) විසින් බඩ ඉරිඟු පිටි භාවිතා කරමින් ස්ප්‍රීතු නිෂ්පාදනය කිරීම පිළිබඳව පහත දැක්වෙන පරිදි ප්‍රමාණාත්මක වෙනස්කම් නිරීක්ෂණය වූයෙන් එම වෙනස්කම් පිළිබඳව සොයාබලා පිළියම් යෙදීමට ද, වගකිවයුතු පාර්ශවයන් මැදිහත් වී ඇති බවක් නිරීක්ෂණය නොවීය.

| වර්ෂය | පිටි භාවිතය | පිටි ටොන් 01 කට ස්ප්‍රීතු හා අශුද්ධ ස්ප්‍රීතු නිෂ්පාදනය | නිෂ්පාදනය කල යුතු ශුද්ධ හා අශුද්ධ ස්ප්‍රීතු ප්‍රමාණය | නිෂ්පාදනය කල ශුද්ධ හා අශුද්ධ ස්ප්‍රීතු ප්‍රමාණය | වෙනස |
|---|---|---|---|---|---|
| | ටොන් | සං.ම.ලී | සං.ම.ලී | සං.ම.ලී | සං.ම.ලී |
| 2017 | 1,711.55 | 396 | 677,773.8 | 800,909.3 | 123,135.5 |
| 2018 | 2,174.4 | 396 | 861,062.4 | 1,003,174.8 | 142,112.4 |
| 2019 සැප්තැම්බර් 30 දක්වා | 1,702.2 | 396 | 674,071.2 | 743,870.6 | 69,799.6 |

**3.3.4.5** රොයල් කාස්ක් ස්කාගාරය විසින් භාවිතා කර ඇති බඩ ඉරිඟු පිෂ්ඨයට සාපේක්ෂව කාර්මික තාක්ෂණ ආයතනයේ නිර්දේශ ප්‍රකාරව නිපදවිය යුතු එතිල් මධ්‍යසාර ප්‍රමාණය සහ සකේ නිෂ්පාදන ප්‍රමාණය සමඟ ස්කාගාරය විසින් සත්‍ය වශයෙන් නිපදවා ඇති ප්‍රමාණයත් අතර පහත පරිදි නොගැලපීම් අවස්ථා නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් සුරාබදු නිළධාරීන්ගේ අවධානයක් යොමු වී ඇති බවක් විගණනයට නිරීක්ෂණය නොවීය.

| වර්ෂය | යෙදවුම් පිෂ්ඨය | කාර්මික තාක්ෂණ ආයතනයේ නිර්දේශ අනුව නිපදවිය යුතු ප්‍රමාණය | | නිපදවා ඇති ප්‍රමාණය | |
|---|---|---|---|---|---|
| | | සකේ | ස්ප්‍රීතු | සකේ | ස්ප්‍රීතු |
| | මෙ.ටොන් | තොග ලීටර් | සං.ම.ලී. | තොග ලීටර් | සං.ම.ලී. |
| 2019 | 840.71 | 2,076,553 | 294,248 | 1,438,500 | 401,675 |
| 2020 ජුනි දක්වා | 3178.1 | 7,849,907 | 1,112,335 | 140,000 | 1,888,472 |

**3.3.4.6** අයි.ඩී. එල්. නිෂ්පාදනාගාරය විසින් ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා නිෂ්පාදනය සඳහා යොදාගත් ස්ප්‍රීතු ප්‍රමාණය හා මධ්‍යසාර නිෂ්පාදනය අතර පහත වෙනස්කම් නිරීක්ෂණය විය.මේ සම්බන්ධයෙන්ද සුරාබදු නිළධාරීන්ගේ අවධානයක් යොමු වී ඇති බවක් විගණනයට නිරීක්ෂණය නොවීය.

| වර්ෂය | භාවිතා කල ස්ප්‍රීතු සම්මත සැර ලීටර | මධ්‍යසාර නිෂ්පාදනය සම්මත සැර ලීටර | වෙනස සම්මත සැර ලීටර |
|---|---|---|---|
| 2015 | 6,091,157.50 | 6,063,227.06 | 27,930.43 |
| 2016 | 5,609,812.98 | 4,653,049.05 | 956,763.93 |
| 2017 | 4,691,429.63 | 4,641,930.18 | 49,499.45 |

**3.3.4.7** රෝයල් කාස්ක් ඩිස්ටිලරීස් පුද්ගලික සමාගමට නිකුත් කර තිබූ සුරාබදු බලපත්‍රවලට අදාළ සුරාබදු නිවේදනවල සඳහන් කොන්දේසිවලට වැඩිමනක් වශයෙන් සමාගම හා සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා සමඟ 2018 ජනවාරි 12 සහ 2018 පෙබරවාරි 16 දින එළඹි ගිවිසුම්වල සඳහන් රීති ප්‍රකාරව කටයුතු නොකළ අවස්ථා පහත පරිදි නිරීක්ෂණය විය.

(අ) සකේ නිෂ්පාදනය අවම වශයෙන් මසකට තොග ලීටර් 150,000 ක් සම්පූර්ණ කළ යුතු බවට එකඟ වී ඇතත් ඒ අනුව කටයුතු නොකළ අවස්ථා පහත පරිදි නිරීක්ෂණය විය.

| මාසය | 2018 වර්ෂය | 2019 වර්ෂය | 2020 වර්ෂය |
|---|---|---|---|
| | තොග ලීටර් | තොග ලීටර් | තොග ලීටර් |
| ජනවාරි | - | සම්පූර්ණ කර ඇත. | 40,000 |
| පෙබරවාරි | - | සම්පූර්ණ කර ඇත. | 40,000 |
| මාර්තු | 50,000 | සම්පූර්ණ කර ඇත. | 40,000 |
| අප්‍රේල් | - | 105,000 | - |
| මැයි | 46,500 | සම්පූර්ණ කර ඇත. | - |
| ජූනි | 52,500 | 125,000 | 20,000 |
| ජූලි | 60,000 | 63,500 | |
| අගෝස්තු | 95,300 | 59,000 | |
| සැප්තැම්බර් | 35,000 | 60,000 | |
| ඔක්තෝබර් | සම්පූර්ණ කර ඇත. | 60,000 | |
| නොවැම්බර් | 100,000 | 40,000 | |
| දෙසැම්බර් | සම්පූර්ණ කර ඇත. | 40,000 | |

අවම නිෂ්පාදන ඉලක්කය සම්පූර්ණ කිරීමට නොහැකි උවහොත් ඊළඟ මස ස්කාගාරයේ ස්ප්‍රීතු ආසවන කටයුතු අත්හිටුවීමේ බලය දෙපාර්ශවය විසින් එළඹගෙන තිබුණද පළමු පාර්ශවය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) පින්වත්තමුල්ල, බතලවත්ත ලිපිනයේ ඉදිකිරීම් කටයුතු අවසන් කරගන්නා තෙක් 2018 පෙබරවාරි 16 දින සිට තුන්මසක කාලයක් සඳහා පමණක් ස්කාගාර පරිශ්‍රයේ සකේ නිෂ්පාදනය කර ගලගෙදර, පාදුක්ක යන ස්ථානයේ බෝතල්ගත කිරීම සඳහා බලපත්‍රය ලබා දීමට ගිවිසුම් ප්‍රකාරව එකඟ වී තිබූ අතර 2020 ජූලි 14 විගණිත දින වනවිට වසර

දෙකක් ඉක්මවා ඇතත් එම පරිශ්‍රයේම සකේ නිෂ්පාදනය බෝතල්ගත කිරීමේ කටයුතු සිදු කරමින් පැවතුණි.

(ඇ) 2018 පෙබරවාරි 16 දින කාර්මික තාක්ෂණ ආයතනයේ අංක CS1801414 දරණ වාර්ථාව අනුව මූලික අවස්ථාවේ ආසවණයෙන් (Fermented wash) ලැබෙන එතනෝල් සැර ප්‍රමාණයට සකේ නිෂ්පාදනයේ සැර ප්‍රමාණය සමාන විය යුතු බව දක්වා ඇතත් සමාගම විසින් නිෂ්පාදනය කර ඇති සකේ වල මධ්‍යසාර සැර සියයට 12.5 ක් ලෙස පැවතුණි. (2017 වර්ෂයේ නිෂ්පාදනය කරන ලද සකේවල සැර සියයට 15 ක් ලෙස දැක්වුණි.) ඒ අනුව කාර්මික තාක්ෂණික ආයතනයේ නිර්දේශවලට පටහැනිවීම විගණනයේදී මතභේදයට ලක්වුණි.

### 3.3.5 නිෂ්පාදන ප්‍රමිතිය

පරිපාක ස්ප්‍රීතු මූලයන් ලෙස භාවිතා කර පරිභෝජනය සඳහා නිෂ්පාදනය කරනු ලබන මත්පැන් වර්ග වෙළඳපලට නිකුත් කිරීමට ප්‍රථමයෙන් නිෂ්පාදකයින් විසින් වර්ණ කාරකයන් යෙදීම සිදු කරනු ලබන අතර එක් එක් වර්ගවල අරක්කු හෝ විදේශ මත්පැන් වර්ග සඳහා රසකාරකයන් යොදා රසගන්වනු ලැබේ. මෙම සියළු කටයුතු සුරාබදු නිවේදනයන්හි සඳහන් කොන්දේසිවලට අනුකූලව නිෂ්පාදකයා විසින් සිදු කරනවාද යන්න සොයා බැලීමේ වගකීම සුරාබදු නිලධාරීන් වෙත පැවරේ. එක් එක් මත්පැන් වර්ග නිෂ්පාදනයේදී අනුමත ප්‍රමිතීන් හා සැර ප්‍රමාණයන් යටතේ නිෂ්පාදනය කරනු ලබන බවත්, ලේබල්වල ඇතුළත් කලයුතු සියලුම තොරතුරු නිවැරදිව ඇතුළත් කර ඇතිද යන බවත් සොයාබැලීම සුරාබදු නිලධාරීන්ගේ වගකීම වේ. තවද ස්කාගාරවල ඇති වෙන් වෙන් සලාංගවලින් ගත් ආශ්‍රතවල ආසවනය සිදු වන විවිධ අවස්ථාවලදී නිදර්ශක ලබාගෙන රජයේ රසපරීක්ෂක වෙත යවා විශ්ලේෂණ වාර්තාවක් ලබාගත යුතුවේ. එලෙස විශ්ලේෂණ වාර්තා ලබාගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

**3.3.5.1** දෙපාර්තමේන්තු ශිල්පීය නියෝග ප්‍රකාරව මාසිකව නිදර්ශක ලබාගෙන රජයේ රස පරීක්ෂක වෙත යොමු කල යුතු වුවත් ඒ අනුව කටයුතු නොකල අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය. ලබාගත් නිදර්ශක රස පරීක්ෂක වෙත යොමුකිරීම ප්‍රමාද වූ අවස්ථා නිරීක්ෂණය වූයෙන් ප්‍රමිතියෙන් යුත් අරක්කු වෙළඳපලට නිකුත් වේද යන්න පිළිබඳව විගණනයේදී ගැටළු සහගත විය. (විස්තර ඇමුණුම - 04)

**3.3.5.2** ලබා ගන්නා ලද නිදර්ශක වල ලේබලයේ සඳහන් සැර ප්‍රමාණය සහ රජයේ රස පරීක්ෂක වාර්තා අනුව සැර ප්‍රමාණය අතර වෙනස්කම් පැවති අවස්ථා ඇමුණුම 05 පරිදි නිරීක්ෂණය විය. රා වල පැවතිය යුතු ආම්ලිකතාව අනුමත සීමාව තුල ඇතුලත් නොවීම පිළිබඳව වාර්තා වී ඇතත් ඒ සම්බන්ධයෙන් සමථ ගාස්තු අය කිරීම හෝ සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**3.3.5.3** රස පරීක්ෂක වාර්තා ලැබීමෙන් පසු අදාල සාම්පල් ලේගරගත කිරීමට හෝ සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොමැති අවස්ථා ද නිරීක්ෂණය විය. උදා :- ඇක්මී ස්කාගාරය 2018 දෙසැම්බර් 26 දින සිට 2019 සැප්තැම්බර් 18 දින දක්වා ගත් සාම්පල් 80 ක් කාර්යාලය තුල තිබුණු බව නිරීක්ෂණය විය.

**3.3.5.4** නිෂ්පාදකයන් විසින් නව නිෂ්පාදනයන් හඳුන්වාදීමට කටයුතු සිදුකිරීමේ දී එම නව නිෂ්පාදන හඳුන්වාදීමට අදාලව නිෂ්පාදනාගාරය තුළ ඒ සඳහා අවශ්‍ය පහසුකම් හා අවශ්‍යතා සපුරා තිබේද යන්න නිලධාරින් විසින් සොයා බැලිය යුතුවේ. එසේම එම නව නිෂ්පාදනයන්ට අදාල නියැදි රජයේ රස පරීක්ෂක වෙත යොමු කර අදාල විශ්ලේෂණ වාර්තා ලබාගෙන නියමිත ප්‍රමිතියෙන් යුක්තද යන්න පරීක්ෂා කල යුතුවේ. එම රස පරීක්ෂක වාර්තා අනුව ප්‍රමිතිය සපුරා ඇත්නම් අදාල ලේබල සඳහා අනුමැතිය ලබාදිය යුතුවේ. වී.ඒ. නිෂ්පාදනාගාරය විසින් 2017 වර්ෂයේදී, V.A. Black Arrack (ග්‍රේන් ස්ප්‍රීතු කලවම් කිරීම තුලින් රස වැඩි කිරීම) සහ White Hourse Arrack යන නව මත්පැන් වර්ග 2 ක් හඳුන්වා දීමට අදාලව 2017 ජුලි 14 දින සාම්පල් දෙකක් සුරාබදු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණි. එහෙත් ඒ පිළිබඳ ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇති බවක් විගණනයට නිරීක්ෂණය නොවීමෙන් පෙනීයන්නේ සුරාබදු නිලධාරීන් විසින් විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය අධීක්ෂණ කටයුතු සිදු වී නොමැති බවයි.

**3.3.5.5** හංවැල්ල ඇක්මී නිෂ්පාදනාගාරයෙහි 2018 වර්ෂය සහ 2019 ජනවාරි 01 සිට සැප්තැම්බර් 30 දක්වා කාලපරිච්ඡේදය තුලදී පිළිවෙලින් සංශුද්ධ මධ්‍යසාර ලීටර 892,352.077 ක සහ ලීටර 690,435.436 ක නිෂ්පාදනයන්ට අදාලව සාම්පල ලබාගෙන රජයේ රස පරීක්ෂක වෙත යොමුකර ඇතත් අදාල රස පරීක්ෂක වාර්තා නිෂ්පාදනාගාරයේ පිහිටි සුරාබදු ස්ථානයට ලැබී නොමැති බව අදාල ලිපිගොනුව පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් අදාල නිෂ්පාදිතයන්ගේ අඩංගු මධ්‍යසාර සැර ප්‍රමාණය මෙන්ම ඒවායේ මනුෂ්‍ය පරිභෝජනයට අහිතකර හෝ අනුමත නොවන ද්‍රව්‍යයන් අඩංගුව පවතින්නේද යන්න පිළිබඳව සුරාබදු නිලධාරීන්ගේ අවධානයක් යොමුකර ඇති බවක් නිරීක්ෂණය නොවිය.

**3.3.5.6** V.A. නිෂ්පාදනාගාරය විසින් 2019 මාර්තු, ජුනි, ඔක්තෝබර් මාසවල ලබාගෙන ඇති සාම්පල් 17 කට අදාලව රස පරීක්ෂක වාර්තා විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

**3.3.5.7** **ඩී. සී. එස්. එල්** නව ගුදමට අදාලව විගණනය සඳහා ඉදිරිපත් වූ විශ්ලේෂණ වාර්තා වලට අනුව ලේබලයේ සඳහන් මධ්‍යසාර සැර සහ විශ්ලේෂණ වාර්තා අනුව වාර්තා වී ඇති මධ්‍යසාර සැර පිළිබඳව සැලකිල්ලට ගත් විට ඒ ඒ නිෂ්පාදන සම්බන්ධයෙන් අයවිය යුතු බදු මුදල් නියමිත පරිදි අයවී නොමැති බව නිරීක්ෂණය විය. සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී අවස්ථා 07 දී එසේ අය නොවූ බදු මුදල රු.531,338 ක් විය.

**3.3.5.8** රෝයල් කාස්ක් නිෂ්පාදනාගාරයේ සකේ *නිෂ්පාදනය* සම්බන්ධ විශ්ලේෂණ වාර්තා වලට අදාල පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සකේ නිෂ්පාදනය.

(i) කාර්මික තාක්ෂණික ආයතනයේ අංක CS 1801414 වාර්තාව අනුව සකේ නිෂ්පාදනාගාරයේ මධ්‍යසාර සැර ප්‍රමාණය සියයට 11-11.5 ත් අතර විය යුතුබව දක්වා තිබුණි. දෙපාර්තමේන්තුව විසින් සකේ නිෂ්පාදනය කිරීම සඳහා නිෂ්පාදනාගාර සමාගම සමග 2018 වර්ෂයේදී එළඹි ගිවිසුම ප්‍රකාරව සකේ නිෂ්පාදනයේ මධ්‍යසාර සැර ප්‍රතිශතය සියයට 15ක් විය යුතු බව සඳහන්ව තිබීම ප්‍රශ්ණගත කරුණක් විය.

(ii) සකේ නිෂ්පාදනයන් සම්බන්ධයෙන් රජයේ රසපරීක්ෂක වෙත නිදර්ශක යැවීම වාර දෙකකට පමණක් සීමා වී තිබූ අතර නිෂ්පාදනාගාර සමාගම විසින් එදිනෙදා නිෂ්පාදනවලට අදාල නිදර්ශක පෞද්ගලික රසායනාගාරයකට යොමු කර විශ්ලේෂණ වාර්තා ලබා ගැනීමට කටයුතු කර තිබුණි. එම විශ්ලේෂණ වාර්තා අනුව ලේබලයේ සඳහන් මධ්‍යසාර සැර සහ නිදර්ශක වල සඳහන් සැර අතර වෙනස්කම් නිරීක්ෂණය විය. විස්තර ඇමුණුම 05 හි දැක්වේ.

(iii) 2020 ජුනි 30 දින ලේගර අංක බී-18 න් ලබාගත් නිදර්ශකයේ ලේබලය අනුව මධ්‍යසාර සැර සියයට 12.5 (V/V) ක් වුවත් රසායනාගාර විශ්ලේෂණ වාර්තාව අනුව සියයට 10.47 (V/V) ක් බව සඳහන්ව තිබුණි. මෙය බෝතල්ගත නොකරන ලෙස වාර්තාවේ සඳහන්ව තිබුණද සංශුද්ධ මධ්‍යසාර ලීටර 639.924 ක් බෝතල්ගතකර රු.593,931.6 ක බදු මුදලක් දෙපාර්තමේන්තුව විසින් අයකර තිබුණි. ඒ අනුව ප්‍රමිතියෙන් යුත් මධ්‍යසාර නිෂ්පාදන වෙළඳපලට නිකුත් කිරීම

කෙරේ සුරාබදු නිලධාරීන්ගේ අවධානය යොමු වී නොමැති බව නිරීක්ෂණය කෙරේ.

(iv) 2020 ජුනි 30 දින ලේගර අංක බී-24 න් ලබාගත් නිදර්ශකයේ විශ්ලේෂණ වාර්තාව අනුව මධ්‍යසාර සැර ප්‍රතිශතය 11.80 (V/V) ක් වූයෙන් බෝතල්ගත කිරීම නතර කර තිබූ මෙම තොගය සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග මොනවද යන්න විගණනයට ඉදිරිපත් නොවීය.

(v) ඉහත සඳහන් පරිදි විශ්ලේෂණ වාර්තා වලට අනුව නිෂ්පාදනයන්වල සම්මත සැර පිළිබඳ ප්‍රමාණාත්මක විචලතාවක් නිරීක්ෂණය වුවද ඒ පිළිබඳව සුරාබදු නිලධාරීන්ගේ අවධානයක් යොමු වී නොතිබුණි. වෙළඳසැලට නිකුත් කර ඇති ප්‍රමිතියෙන් තොර නිෂ්පාදනවලට අදාලව කාර්මික අපරාධ වාර්තා කර ඇති බවක්ද විගණනයට නිරීක්ෂණය නොවීය.

(vi) විශ්ලේෂණ කටයුතු සඳහා ගනුලබන නිදර්ශක පිළිබඳව නිදර්ශක ලබාගත් දිනය, ලබාගත් නිලධාරියාගේ නම, වර්ගය සහ ප්‍රමාණය, විශ්ලේෂණය පිණිස ගෙන යන නිලධාරියාගේ අත්සන, ප්‍රතිඵල සහ නිදර්ශකය නැවත භාරදුන් දිනය පිළිබඳ විස්තර ඇතුලත් ලේඛනයක් පවත්වාගත යුතු වුවත් ඒ අනුව ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පැසවුම්කරණයෙන් ලබාගන්නා එතිල් මධ්‍යසාරවල මධ්‍යසාර ප්‍රතිශතය විවිධ අවස්ථා වලදී නිර්ණය කිරීම සඳහා ප්‍රමිත කරන ලද උපකරණ කට්ටලයක් සුරාබදු ස්ථානය තුල තිබීම අනිවාර්ය වුවද රෝයල් කාස්ක් නිෂ්පාදනාගාරය තුල එවැනි උපකරණයක් නොතිබුණි. ඒ අනුව මධ්‍යසාර සැර පරීක්ෂාව සුරාබදු නිලධාරීන්ගේ ප්‍රධාන කාර්යයක් වන අතර ඒ සඳහා දෙපාර්තමේන්තුවේ ඉහල නිලධාරීන්ගේ අවධානය යොමු වී ඇති බවක්ද විගණනයට ඉදිරිපත් නොවීය.

### 3.3.6 බෙදාහැරීම

අනුමත කාර්යයන් සඳහා සුරාබදු ආඥාපනතේ 13 වැනි වගන්තියේ සඳහන් ප්‍රතිපාදනවලට අනුකූලව ස්ප්‍රීතු අපනයනය හෝ ආනයනය කරනු ලබන අවස්ථාවලදී හෝ ස්කාගාරයකින් හෝ ගුදමකින් ස්ප්‍රීතු ප්‍රවාහනය කරනු ලබන අවස්ථාවකදී සුරාබදු අවසර පත්‍රයක් ලබාගත යුතුය. මෙම අවසර පත්‍රය ඩී - 28 ලෙස හඳුන්වනු ලැබේ. ස්කාගාරයක හෝ ගුදමකින් නම් අවසරපත්‍රය ස්කාගාර භාර නිලධාරියා විසින්ද පළාතක හෝ දිස්ත්‍රික්කයක නම් එම අවසර පත සුරාබදු අධිකාරී හෝ සහකාර සුරාබදු කොමසාරිස් විසින් නිකුත් කරනු ලැබේ. ස්ප්‍රීතු ආනයනය සම්බන්ධයෙන් අවසර පත්‍ර සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබේ.

එමෙන්ම සුරාබදු බලපත්‍ර යටතේ ක්‍රියාත්මක වනු ලබන නිෂ්පාදනාගාරවලින් සිල්ලර වෙළදාම සඳහා අරක්කු හා බෝතල් රා ප්‍රවාහනය කිරීමේදී සී.එස්.ටී (1) අවසරපත්‍රයක් ලබාගැනීමෙන් පසු ප්‍රවාහනය සිදුකලයුතුවේ. මේ සඳහා මුළු දිවයින පුරා වෙළඳ ආයතන සඳහා බෙදාහැරීම් කටයුතු සිදුකිරීමට අදාල අවසර පත්‍ර ප්‍රධාන කාර්යාලය මඟින් නිකුත් කරනු ලැබේ.

ස්ප්‍රීතු සහ මධ්‍යසාර ප්‍රවාහනය සඳහා ප්‍රවාහන අවසරපත්‍ර පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**3.3.6.1** ප්‍රවාහන අවසරපත්‍රවල සඳහන් ස්ප්‍රීතු ලැබීම් සත්‍ය වශයෙන් ලද බව සනාථ කිරීම (ඩී - 33) ලේඛනයට ඇතුලත් කලයුතු වුවද ඒ අනුව කටයුතු නොකර කොටසක් බන්ධිත කාමරයට බාරදීමෙන් අනතුරුව ඉතිරිය පමණක් ලේඛණගත කිරීම හේතුවෙන් ස්ප්‍රීතු ප්‍රමාණයේ නොගැලපීම් තිබූ අවස්ථා නිරීක්ෂණය විය. වගකිවයුතු නිලධාරීන් ගේ අවධානයක් මේ සඳහා යොමු වී ඇති බවක්ද නිරීක්ෂණය නොවිය. උදා :- V.A. ඩිස්ට්ලරීස් සමාගම (විස්තර ඇමුණුම 06 හි දැක්වේ.)

**3.3.6.2** 2018 වර්ෂය තුලදි නිෂ්පාදනාගාර 6 ක් වෙනුවෙන් ප්‍රධාන කාර්යාල විසින් මධ්‍යසාර ප්‍රවාහන අවසරපත්‍ර ලබාදිම සඳහා භාවිතා කර තිබුණු උප පත්‍රිකා පොත්වල තොරතුරු සහ ඒ ඒ නිෂ්පාදනාගාරවල වාර්ෂික නිෂ්පාදනය හා ප්‍රවාහනය පිළිබඳ විස්තර පහත දැක්වේ. එම තොරතුරු අනුව ප්‍රවාහන අවසරපත්‍ර ලබාදීමේදී දෙපාර්තමේන්තුව විසින් නිෂ්පාදනාගාරයේ සිදුකරන නිෂ්පාදිතය පිළිබඳව අවධානය යොමුකර ඇති බවක් නිරීක්ෂණය නොවීය.

| නිෂ්පාදනාගාරය | 2018 වර්ෂයේ බදු අයකල නිෂ්පාදනය | ලබාදී ඇති අවසර පත්‍ර සංඛ්‍යාව (CST) | වරකට ප්‍රවාහනය කලහැකි උපරිම තොගය | නිෂ්පාදිතය ප්‍රවාහනය කිරීම සඳහා අවශ්‍යවන වාර ගණන දළ වශයෙන් |
|---|---|---|---|---|
| | තොග ලීටර | | තොග ලීටර | |
| පෙරිසිල් | 1,492,113 | 363 | 3,403,506 | 01 |
| රොක්ලන්ඩ් | 5,080,856 | 69 | 246,486 | 21 |
| V.A. නිෂ්පාදනාගාරය | 1,286,289 | 56 | 286,680 | 05 |
| ඇක්මී | 2,838,011 | 65 | 328,000 | 09 |
| හිඟුරාන | 1,736,308 | 54 | 388,500 | 05 |
| රොයල් කාස්ට් | 313,149 | 06 | 23,370 | 14 |

(අ) ඉහත වෙනස්කම් අනුව නිරීක්ෂණය වන්නේ නියමිත පරිදි බදු නොගෙවූ මත්පැන්ද ප්‍රවාහනය සඳහාද ඉඩ සැලසෙන බවයි. තවද ප්‍රවාහන අවසර පත්‍ර ලබාදීමේදී වරකට උපරිම ධාරිතාවය සඳහන්කර එම අවසරය අවුරුද්ද පුරා බලපවත්වන ලෙස සඳහන් කර තිබීමෙන් වාර සංඛ්‍යාව වැඩි කරමින් ප්‍රවාහනය කිරීමේදී සීමා රහිතව මත්පැන් ප්‍රවාහනය කිරීමේ අවස්ථාවට ඉඩ ලබාදී තිබුණි.

(ආ) නිෂ්පාදනාගාරයේ නිෂ්පාදන ධාරිතාවය පිළිබඳ සලකා බැලීමකින් තොරව ප්‍රවාහන බලපත්‍ර ලබා දීමට ඉඩ සැලසී තිබීමෙන් මත්පැන් නිෂ්පාදකයින්ට වංචා හා දූෂණ සිදුකිරීමට ඉඩ ප්‍රස්ථා සැලසී ඇතැයි යන සැකය බැහැරකල නොහැකි විය. එසේම එමගින් නීති විරෝධි මත්පැන් ප්‍රවාහනය කිරිම තුලින් රාජ්‍ය ආදායම අහිමි වීමට ඉඩකඩ ඇතැයි යන සැකයද විගණනයේදී බැහැර කල නොහැකි විය.

**3.3.6.3** නිෂ්පාදනාගාරය සඳහා ස්ප්‍රීතු ලැබීමේදී ප්‍රවාහන අවසර පත්‍රයේ සඳහන් ස්ප්‍රීතු ප්‍රමාණය සත්‍ය වශයෙන් ලද බව සනාථ කිරීම සඳහා ඩී - 33 ලේඛනයට ඇතුලත් කර එම ස්ප්‍රීතුවල තොග ලීටර ප්‍රමාණය, නිරපේක්ෂ මධ්‍යසාර ලීටර ප්‍රමාණය, සැර, ද්‍රවමාන පාඨකය යන විස්තර සඳහන් කල යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. උදා :- V.A. ඩිස්ටිලරීස් සමාගම.

**3.3.6.4** ස්කාගාර සහ නිෂ්පාදනාගාර සඳහා ස්ප්‍රීතු සහ නිෂ්පාදිත මධ්‍යසාර ප්‍රවාහනය සිදුකිරීමේදී ගේට්ටු අවසරපත්‍ර භාවිතා කිරීම හා ආරක්ෂක අංශ විසින් ගේට්ටු සටහන් තබාගැනීමක් සිදුකර නොතිබුණි. මෙය අභ්‍යන්තර පාලනයේ දුර්වලතාවක් ලෙස නිරීක්ෂණය වේ.

**3.3.6.5** රෝයල් කාස්ක් ස්කාගාරයේ සකේ නිෂ්පාදනය, ප්‍රවාහන බලපත්‍ර (ඞී-28) නිකුත් කිරීම සහ ලේඛනගත කිරීම (ඞී-29) පහත පරිදි නිරීක්ෂණය විය. ඒ අනුව නිෂ්පාදනය පිළිබඳ සලකා බැලීමකින් තොරව ප්‍රවාහන බලපත්‍ර ලබා දී ඇති බවක් ප්‍රවාහන බලපත්‍ර සමග ලේඛණගත ශේෂයන්ගේ නොගැලපීමකින් නිරීක්ෂණය විය.

| වර්ෂය | සකේ නිෂ්පාදනය | ප්‍රවාහනය ඞී-28 අනුව | ලේඛනගත කිරීම ඞී-29 අනුව |
|---|---|---|---|
| | තොග ලීටර් | තොග ලීටර් | තොග ලීටර් |
| 2018 | 860,800 | 863,300 | 855,800 |
| 2019 | 1,438,500 | 1,495,500 | 1,438,500 |

**3.3.6.6** අයි.ඞී.එල්. නිෂ්පාදනාගාරය සඳහා 2019 අප්‍රේල් 23 දිනැති අංක D327420 දරන ප්‍රවාහන අවසර පත්‍රය මගින් ස්ප්‍රීතු තොග ලීටර් 24967.2 ක් ස්ප්‍රීතු ආනයනය කිරිම ස්ප්‍රීතු තොග භාරගැනීමේ ලේඛනයට (ඞී.33) ඇතුලත් කර නොතිබුණි.

**3.3.6.7** අයි.ඞී.එල්. නිෂ්පාදනාගාරය සඳහා ප්‍රවාහන අවසර පත්‍ර අංක ඞී-319261 සහ අවසර පත්‍ර ඞී-327396 මගින් පිළිවෙලින් තොග ලීටර් 24,305 ක් සහ තොග ලීටර් 24,500 ක් ආනයනය කිරීම් ලේගරවල ලැබීම් ලෙස ඞී-8 ලේඛනයට ඇතුලත් කර නොතිබුණි.

**3.3.6.8** 2018 සහ 2019 වර්ෂ වල අයි.ඩී.එල්. නිෂ්පාදනාගාරයේ නිෂ්පාදනයන් ප්‍රවාහනය කිරීම සඳහා මත්පැන් ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම පහත පරිදි විය.

| වර්ෂය | නිෂ්පාදනය | නිකුත් කර ඇති ප්‍රවාහන බලපත්‍ර සංඛ්‍යාව | එක් වරකදී උපරිම ප්‍රවාහනය |
|---|---|---|---|
| | සං.ම.ලී | | සං.ම.ලී |
| 2018 | 2,462,020 | 55 | 444,000 |
| 2019 | 2,367,220 | 46 | 325,000 |

උක්ත කරුණු අනුව නිෂ්පාදනය හා සාපේක්ෂව සලකා බැලීමකින් තොරව දෙපාර්තමේන්තුව විසින් ප්‍රවාහන බලපත්‍ර නිකුත් කර ඇති බවත් මෙමගින් දූෂසන්ධානයන් ඇතිවීම නොවැලැක්විය හැකි බවත් විගණනයේදී බැහැර කල නොහැකි විය.

**3.3.7 පොත්පත් හා ගිණුම් ප්‍රකාශ පවත්වාගැනීම**

සුරාබදු ආඥා පනතේ විධිවිධානයන්ට අනුකූලව ප්‍රකාශයට පත්කර ඇති සියළුම අතුරු ව්‍යවස්ථාවන්හි සඳහන් නියාමනයන් හා රෙගුලාසි සහ කොන්දේසිවලට යටත්ව ස්කාගාර හා නිෂ්පාදනාගාරවල පාලන කටයුතු පවත්වාගෙනයාම ස්කාගාර හා නිෂ්පාදනාගාරවල අනුයුක්ත කරනු ලබන සුරාබදු නිලධාරීන්ගේ ප්‍රධාන වගකීම වේ. එම නිලධාරීන් විසින් විවිධ කාර්යයන් සම්බන්ධයෙන් පවත්වාගත යුතු පොත්පත් හා ලේඛන වල වැරදි කිසිවක් නොමැති බවට සනාථ කල හැකි වන සේ ගිණුම් සියල්ලක්ම හරි වැරදි බැලිය යුතු වුවත් ඒ අනුව කටයුතු සිදු වී නොමැති බව පහත කරුණු අනුව නිරීක්ෂණය විය.

**3.3.7.1** ස්කාගාරයේ එක් එක් ලේගරයට දැමූ ස්ප්‍රීතු හෝ නිකුත් කල ස්ප්‍රීතු පිළිබඳව හා ලේගරයකින් කරනු ලබන ගනුදෙනු (ලැබීම් හා නිකුත් කිරීම්) ලේගර ලේඛනයේ (ඩී - 8) වෙන වෙනම නිවැරදිව සටහන් කල යුතු අතර සෑම මාසයකම අවසානයේ එහි ශේෂය, ගබඩාකර තැබූ ස්ප්‍රීතු ආදිය පිළිබඳ සම්පාදන ලේඛණයට (ඩී - 9) ඇතුලත් කල යුතුවේ. එම ලේඛනවල පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ඩී-9 ලේඛනයේ යම්කිසි මාසයක අවසාන ශේෂය ඊළග මාසයේ ආරම්භක ශේෂය විය යුතු වුවත් ඒ අනුව නොගැලපුනු අවස්ථා ඇමුණුම 07 පරිදි නිරීක්ෂණය විය. ඒ අනුව ලේඛන වලින් නිවැරදි තොග ශේෂයන් පිළිඹිබු කෙරේද යන්න විගණනයේදී ප්‍රශ්නගත කරුණක් විය.

(ආ) ලේගරයකින් වෙනත් ලේගරයකට ස්ප්‍රීතු මාරුකිරීමේදී ස්ප්‍රීතු නිකුත්කිරීම් හා ලේගරයට ලැබෙන ස්ප්‍රීතු ප්‍රමාණය සමාන වියයුතු වුවත් (ඩී - 9) ලේඛණය නොසැසුදුනු අවස්ථා ඇමුණුම 08 පරිදි නිරීක්ෂණය විය. මෙහිදී නිරීක්ෂණය වූ වෙනස ප්‍රමාණාත්මක වූ හෙයින් එය අපතය ලෙස සැලකිය නොහැකි බවත් අධීක්ෂණ නිලධාරීන්ගේ අවධානයට ලක් වී නොමැති බවත් නිරීක්ෂණය විය

(ඇ) නිෂ්පාදනාගාරයේ අරක්කු නිෂ්පාදනය සඳහා නිකුත් කල ස්ප්‍රීතු ප්‍රමාණය හා ''ලැබීම් (ඩී - 8)" ලේඛනයේ සඳහන් කරණු ලබන අතර, මාසය අවසානයේ එහි ශේෂය (ඩී - 9) ලේඛනයට ඇතුලත් කෙරේ. එම ලේඛන අනුව නිකුත් කල ස්ප්‍රීතු හා ලැබීම් ස්ප්‍රීතු ශේෂ අතර ප්‍රමාණාත්මක වෙනස්කම් (විස්තර ඇමුණුම - 09 හි දැක්වේ) පැවතිය ද ඒ පිළිබඳව අධීක්ෂණ නිලධාරීන්ගේ අවධානයට ලක් වී නොමැති බව නිරීක්ෂණය විය.

(ඈ) ඩී.සී.එස්.එල්. නව ගුදම සඳහා ස්ප්‍රීතු මිලදී ගැනීම් ඩී-33 ලේඛනය, ඩී-8 ලේඛනය සහ ඩී-9 ලේඛනය අනුව නොසැසඳුනු අවස්ථා පහත පරිදි විය.

| වර්ෂය හා මාසය | ඩී-8 ලේඛනය අනුව | ඩී-9 ලේඛනය අනුව | ඩී-33 ලේඛනය අනුව |
|---|---|---|---|
| | සං. ම. ලී. | සං. ම. ලී. | සං. ම. ලී. |
| 2019 | | | |
| ජනවාරි | 325,515.20 | 384,999.4 | 366,054.3 |
| පෙබරවාරි | 285,674.9 | 322,546.2 | 323,886.8 |
| මාර්තු | 310,525.2 | 356,761.0 | 357,771.6 |
| අප්‍රේල් | 236,500.70 | 289,952.6 | 306,688.0 |

ඉහත නිරීක්ෂණ අනුව පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් පිළිබඳව හෝ සුරාබදු නිලධාරීන්ගේ අවධානය යොමු වී ඇති බවක් නිරීක්ෂණය නොවන අතර ඒ අනුව සුරාබදු ආදායම ආරක්ෂා කිරීම හා පාලනය කිරීම සඳහා නිලධාරීන්ගේ මැදිහත්වීම සතුටුදායක මට්ටමක නොවූ බව නිරීක්ෂණය විය.

(ඉ) ඩී.සීඑස්.එල්. නව ගුදමට අදාලව ඩී-8 ලේඛනයට අනුව ලේගර අංක 28 හි 2019 ජනවාරි 24 දිනට ශේෂය සංශුද්ධ මධ්‍යසාර ලීටර් 8,497.3 ක් පැවති අතර 2019 නොවැම්බර් 30 දින දක්වාම එම ලේගරයට අදාල කිසිම ගනුදෙනුවක් සිදුවී නොතිබුණි. 2019 දෙසැම්බර් 01 දින සිට නව ඩී-8 ලේඛනයක් පවත්වා තිබූ අතර එදිනට ලේගර අංක 28 හි ශේෂය ලෙස සංශුද්ධ මධ්‍යසාර ලීටර් 5326.3 ක් ලෙස සටහන් කර තිබුණි. ඒ අනුව සංශුද්ධ මධ්‍යසාර ලීටර් 3171 ක අඩුවීමක් විගණනයේදී නිරීක්ෂණය විය. මේ පිළිබඳව සුරාබදු නිලධාරීන්ගේ අවධානයක් යොමු වී නොමැති බවක් විගණනයේදී නිරීක්ෂණය විය.

**3.3.8 ගබඩා කිරීම**

**3.3.8.1** නිෂ්පාදනාගාරය සතුව පැවති ස්ප්‍රීතු ප්‍රමාණය සහ ලැබුණු ස්ප්‍රීතු ප්‍රමාණයත්, අපතයට ඉඩහැරීමෙන් පසු අරක්කු නිෂ්පාදනය සඳහා භාවිතා කල ස්ප්‍රීතු ප්‍රමාණයත් ගැලපීමෙන් පසු ලැබෙන ශේෂය සහ සම්පාදන ලේඛනය (ඩී - 9) අනුව පවතින ශේෂය අතර වෙනස්කම් පැවති අවස්ථා නිරීක්ෂණය විය. ඒ අනුව පෙනී යන්නේ සුරාබදු නිලධාරීන් විසින් විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය අධීක්ෂණ කටයුතු සිදු වී නොමැති බවත් ය. විස්තර පහත දැක්වේ.

| නිෂ්පාදනාගාරය | කාලපරිච්ඡේදය | නොසැසඳුනු අගය<br>සං.ම. ලීටර් |
|---|---|---|
| V.A. ඩිස්ටිලරීස් පුද්. සමාගම | 2019 ජනවාරි සිට සැප්තැම්බර් 30 දක්වා | 90,505.7 |
| | 2018 | 7998.3 |
| හිඟුරාන නිෂ්පාදනාගාරය | 2018 | 997.6 |
| ඇක්මී නිෂ්පාදනාගාරය | 2018 | 2,045.7 |
| ඩී.සීඑස්.එල්. පැරණි ගුදම | 2019 ජනවාරි සිට දෙසැම්බර් දක්වා | 353,319.0 |
| | 2020 පෙබරවාරි, මැයි | 455.0 |

| | | |
|---|---|---|
| ඩී.සීඑස්.එල්. නව ගුදම | 2019 ජනවාරි සිට දෙසැම්බර් දක්වා | 48,355.0 |
| | 2020 මාර්තු, ජුනි | 12,995.8 |
| රෝයල් කාස්ක් ඩිස්ටිලරීස් | 2019 ජනවාරි දෙසැම්බර් දක්වා | 30,653.9 |
| | 2020 ජනවාරි, ජුනි | 11,682.8 |
| අයි.ඩී.එල්. නිෂ්පාදනාගාරය | 2019 මාර්තු, දෙසැම්බර් | 8,176.6 |
| | 2020 ජනවාරි | 562.6 |

**3.3.8.2** නිෂ්පාදනාගාර සඳහා ස්ප්‍රීතු ලැබීම්, ප්‍රවාහන අවසර පත්‍රවල සඳහන් අගය හා සත්‍ය ශේෂය පිළිබඳව තහවුරු කර ඩී - 33 ලේඛනයට ඇතුලත් කෙරේ. නිෂ්පාදනාගාරය සඳහා ස්ප්‍රීතු ලැබීම් සටහන් කරන ඩී - 33 ලේඛනයෙහි හා ඩී- 9(සම්පාදන) ලේඛනය අතර නොගැලපීම් දක්නට ලැබුණි.(ඇමුණුම - 10). මේ අනුව අධීක්ෂණ කටයුතු භාරව සිටින සුරාබදු නිලධාරීන් වගකීමෙන් යුතුව කටයුතු කර ඇත් ද යන්න පිළිබඳ ගැටලුසහගත විය.

**3.3.8.3** V.A.නිෂ්පාදනාගාරය සඳහා ස්ප්‍රීතු ලබාගැනීමේදී බැරල් (Drum) භාවිතා කර තිබුණි. නිෂ්පාදනාගාරය තුල බන්ධිත කාමරයක් (Bond room) පැවතියද ස්ප්‍රීතු බන්ධිත කාමරය (Bond room) හරහා නොගොස් ඍජුවම ලේගරවලට ලබාගන්නා අවස්ථා පවතින බව සනාථ කිරීමේ ලේඛනය වන ඩී - 33 ලේඛණය අනුව නිරීක්ෂණය විය. මේ හේතුවෙන් නිෂ්පාදනාගාරය සඳහා ලැබී ඇති ස්ප්‍රීතු පිළිබඳ නිවැරදි දත්ත සනාථ කිරීම් ඩී - 33 ලේඛණයෙන් පිළිබිඹු නොවන බව නිරීක්ෂණය විය. ඒ අනුව විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකිරීම පිළිබඳ සුරාබදු නිලධාරීන්ගේ ප්‍රමාණවත් අධීක්ෂණයක් සිදු වී නොමැති බව නිරීක්ෂණය විය.

**3.3.8.4** 2018 වර්ෂයේ හා 2019 ඔක්තෝබර් 31 දක්වා කාලපරිච්ඡේදයට අදාලව V.A. නිෂ්පාදනාගාරයෙහි බන්ධිත කාමරයේ (Bond room) තොග ලේඛණය අනුව ස්ප්‍රීතු ලැබීම් හා තොග සත්‍යාපනය කිරීමේ ලේඛනය (ඩී - 33) අනුව ලැබීම්හි පහත පරිදි වෙනස්කම් නිරීක්ෂණය විය.

| වර්ෂය | බන්ධිත කාමරයේ තොග ලේඛණය අනුව ස්ප්‍රීතු ලැබීම් | ඩී - 33 අනුව ස්ප්‍රීතු ලැබීම් | වෙනස |
|---|---|---|---|
| --------- | -------------------------------- | --------------- | --------- |
| | සං.ම.ලී | සං.ම.ලී | සං.ම.ලී |
| 2018 | 413,807.02 | 431,123.3 | 17,316.28 |
| 2019 ඔක්තෝබර් 30 දිනට | 367,331.25 | 445,932.8 | 78,601.55 |

ඒ අනුව, අනුයුක්ත කර ඇති වගකිව යුතු නිලධාරීන් මේ පිළිබඳව අවධානය යොමු කර ඇති බවක් නිරීක්ෂණය නොවීය.

**3.3.8.5** V.A. නිෂ්පාදනාගාරය විසින් පවත්වාගෙන යනු ලබන ලේගරවලට ස්ප්‍රීතු නිකුත් කිරීම් තොග සත්‍යාපන (ඩී - 33) ලේඛණය සහ බන්ධිත තොග පිළිබඳ වාර්තා අනුව පහත පරිදි වෙනස්කම් පැවතුණි. එම වාර්තා අනුව ප්‍රමාණාත්මක වෙනස්කම් පැවතීම් කෙරෙහි අධීක්ෂණ නිලධාරීන්ගේ අවධානය යොමු වී ඇති බවක් නිරීක්ෂණය නොවීය. ඒ අනුව නිවැරදිව සුරාබදු ආදායම එකතු වන්නේ ද යන්න පිළිබඳව විගණනයේ දී ගැටලු සහගත විය.

| වර්ෂය | බන්ධිත තොග වාර්තා අනුව | ඩී - 33 අනුව | වෙනස |
|---|---|---|---|
| -------- | ------------------------- | -------------- | -------- |
| | සං.ම.ලී | සං.ම.ලී | සං.ම.ලී |
| 2018 | 412,850.08 | 429,921.02 | 17,070.94 |
| 2019 ඔක්තෝබර් 30 දක්වා | 341,838.25 | 433,991.95 | 92,153.7 |

### 3.3.9 අධීක්ෂණය හා හදිසි වැටලීම්

සුරාබදු දෙපාර්තමේන්තුවේ කාර්යභාරයන් යටතේ ස්කාගාර, ගුදම් සහ මත්පැන් නිෂ්පාදනාගාර පාලනය සහ අධීක්ෂණය කිරීම එක් ප්‍රධාන කාර්යයක්වේ. ඒ අනුව අධිකාරී බලයලත් නිලධාරින්ගේ විධිමත් පාලනයකට නිෂ්පාදනාගාර යටත්වේ. සහකාර සුරාබදු කොමසාරිස්වරුන් ත්‍රෛමාසිකව එක් වරක් සහ සුරාබදු අධිකාරීවරුන් මසකට එක් වරක් අදාල නිෂ්පාදනාගාර පූර්ණ පරීක්ෂණයකට ලක්කල යුතුය. මීට අමතරව හැකි සෑම අවස්ථාවලදීම ස්ප්‍රීතු, නිෂ්පාදනාගාරයට ගෙන එනු ලබන අවස්ථාවලදී සහ නිෂ්පාදන කටයුතු සිදුකරනු ලබන අවස්ථාවලදී අදාල නිෂ්පාදනාගාර පරීක්ෂණයට භාජනය කල යුතුය. නිවේදනයන්හි සඳහන් සියළුම කොන්දේසි නිෂ්පාදනාගාර භාර නිලධාරීන් විසින් ක්‍රියාත්මක කර ඇතිද යන වග ඔවුන්ගේ දැඩි අවධානයට

ලක් කළ යුතුය. විගණනයේදී පරීක්ෂණයට ලක්කරන ලද ස්කාගාර හා නිෂ්පාදනාගාර සම්බන්ධයෙන් අධීක්ෂණ නිලධාරීන් විසින් සිදුකල යුතු අවම පරීක්ෂණ වාර ගණනවත් සිදුකර නොමැති බව නිරීක්ෂණය විය. අධීක්ෂණය සිදුකර ඇති අවස්ථා නිරීක්ෂණය වූ ස්ථානවලදී නිෂ්පාදනාගාර විසින් පවත්වාගෙන යනු ලබන ගිණුම් පොත් පත්වල නොගැලපීම්, කපා දැමීම්, ටිපෙක්ස් කර සංඛ්‍යා වෙනස්කර තිබූ අවස්ථා නිරීක්ෂණය වුයෙන් නිසි අධීක්ෂණයක් සිදු වී ඇද්ද යන්නත් නිවැරදිව සුරාබදු ආදායම් එක්රැස් කරන්නේ ද යන්නත් විගණනයේ දී ගැටළු සහගත විය.

### 3.3.10 නීති විරෝධී මත්ද්‍රව්‍ය (සුරා) පිළිබඳ වාර්තාවීම්

සුරාබදු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා පොලීසිය විසින් නීති විරෝධී මත්ද්‍රව්‍ය වලට අදාලව සිදු කරන ලද වැටලීම් පිළිබඳ 2016 සිට 2018 වසර දක්වා විස්තර පහත පරිදි විය.

| ආයතනය | 2016 | 2017 | 2018 |
|---|---|---|---|
| ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව | 32,782 | 40,942 | 36,859 |
| ශ්‍රී ලංකා පොලීසිය | 120,105 | 120,198 | 129,813 |

සුරා හා දුම්කොල කර්මාන්තවල නීත්‍යානුකූල නොවන නිෂ්පාදනයන් වැලැක්වීම තුළින් සමාජ ආරක්ෂාව ලබාදීම සුරාබදු දෙපාර්තමේන්තුවේ මෙහෙවර ලෙස සඳහන් වුවද ඉහත සඳහන් වැටලීම් පිළිබඳව සලකා බැලීමේදී එකී මෙහෙවර ඉටුවී ඇද්ද යන්න පිළිබඳව මතභේදයට ලක්විය. ශ්‍රී ලංකා පොලීසිය විසින් දිවයින පුරා සිදුකර ඇති නීති විරෝධී සුරා වැටලීම් සංඛ්‍යාව දෙස බැලීමේදී 2016 සිට 2018 වසර දක්වා වැඩිවීමක් දක්නට ලැබීමෙන් දීපව්‍යාප්තව නීති විරෝධී මධ්‍යසාරවල සුලබතාවයෙහි ඉහල යාමත් වාර්තාවේ. නමුත් අධිකාරී බලය ලත් සුරාබදු දෙපාර්තමේන්තුවේ, මේ සඳහා වූ කාර්ය සාධනය ඵලදායී ලෙස ඉටු වී ඇද්ද යන්න පිළිබඳව විගණනයේදී මතභේදයට ලක්වන කරුණක් වේ.

## 3.4. නිෂ්පාදනය තුලින් වන සාමාජීය ආර්ථීක බලපෑම

### 3.4.1. සෞඛ්‍යමය ගැටළු

දුම්කොල හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය, ලෝක සෞඛ්‍ය සංවිධානය (ශ්‍රී ලංකා කාර්යාලය), ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය යනාදි ආයතන හා සංවිධාන විසින් ශ්‍රී ලංකාවේ දුම්කොල හා මධ්‍යසාර පිළිබඳ ජාතික සහ සාමාජීය ඍජු පිරිවැය (2015 පිළිබඳ සිදුකරන ලද පර්යේෂණයට අනුව) 2015 වර්ෂයේදී රු. බිලියන 119.66 ක් බවත් මධ්‍යසාර හා දුම්කොල භාවිතයෙන් වන අනිටු ප්‍රතිවිපාකවලට ප්‍රතිකාර කිරීම උදෙසා රු. බිලියන 90.03 වක්‍ර පිරිවැයක් දැරීමට සිදුවන බවත් නිරීක්ෂණය කර ඇත. මෙම පිරිවැය ගණනය කිරීමේදී නීතිය බලගැන්වීමේ පිරිවැය, රක්ෂණ පිරිවැය, මර්ධනය කිරීමේ පිරිවැය සෞඛ්‍ය අමාත්‍යංශයේ පරිපාලක පිරිවැය යනාදි පිරිවැය අන්තර්ගත නොවීය.

සෑම ආකාරයකම රෝගී තත්ත්වයන් පිළිබඳව සලකා බලන විට පෙනී යන කරුණක් වන්නේ මධ්‍යසාර භාවිතයෙන් සිදුවන අනතුරු හා ආබාධවලින් ආර්ථිකයට දැරීමට සිදුවන සමස්ථ වියදම රු.මිලියන 33,922.3 කි. මෙය රටේ සෞඛ්‍ය ආරක්ෂණයට හා ආර්ථීක පද්ධතියට විශාල ලෙස බලපෑම් සිදු කරනු ලැබේ. 2015 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.95 ක් එනම් රු. බිලියන 209.03 ක් දුම්කොල හා මධ්‍යසාර සඳහා වූ සංයුක්ත පිරිවැයක් ආර්ථිකයට දැරීමට සිදුවී ඇති බව ඉහත සිදුකරන ලද පර්යේෂණයට අනුව හෙළිවී තිබුණි.

### 3.4.2. පවුල් සංවිධානවල ගැටළු

උක්ත සඳහන් පර්යේෂණයට අනුව මධ්‍යසාර සම්බන්ධයෙන් වූ අහිතකර ප්‍රතිවිපාකයන් ලෙසට හඳුනාගන්නා ලද ගෘහස්ත ප්‍රචණ්ඩත්වය හා ළමා අපයෝජනයන් සඳහාද අවධානය යොමු කල යුතු බව දක්වා තිබුණි. මේ සඳහා රජයේ මෙන්ම රාජ්‍ය නොවන පාර්ශ්වයන් රැසකට විශාල පිරිවැයක් දැරීමට සිදුවේ. එනම් රක්ෂණාවරණය, නීතිය බලගැන්වීම් පිරිවැය, මර්දනය කිරීමේ පිරිවැය , සෞඛ්‍ය අමාත්‍යංශයේ පරිපාලනමය පිරිවැය හා පුනරුත්තාපන පිරිවැය යනාදිය වේ. මධ්‍යසාර භාවිතය හේතුවෙන් රැකියාවල කාර්ය සාධනය ඉතා අවම මට්ටමක පවතින බවත් දුම්කොල හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය, ලෝක සෞඛ්‍ය සංවිධානය (ශ්‍රී ලංකා කාර්යාලය), ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය යනාදි ආයතන හා සංවිධාන විසින් ශ්‍රී ලංකාවේ දුම්කොල හා මධ්‍යසාර පිළිබඳ ජාතික සහ සාමාජීය පිරිවැය පිළිබඳ 2015 සිදුකරන ලද පර්යේෂණයට අනුව හෙළිවී තිබුණි.

### 3.4.3. රාජ්‍ය ආදායම කෙරෙහි බලපෑම

රජය විසින් බදු ගණනය කිරීම්වලදී මධ්‍යසාර භාවිතයෙන් සිදුවන අනිසි ප්‍රතිවිපාක හේතුවෙන් දැරීමට සිදුවන අතිරේක (වක්‍ර) පිරිවැය (Psychosocial costs impoverishment, diseases and pre mature mortality) පිළබඳව සැලකිල්ලක් දක්වා ඇති බවක් නිරීක්ෂණය නොවීය. එම නිසා රටේ සෞඛ්‍ය, සාමාජීය හා මූල්‍ය ප්‍රතිපත්ති සැකසීමේදී ඉහත කරුණු කෙරෙහි දැරීමට සිදුවන පිරිවැය කෙරෙහි අවධානය යොමු කිරීමේ වැදගත්කම විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

### 3.4.4. නීතිවිරෝධී පරිසරය

දේශපාලන බලපෑම් හෝ වෙනත් සලකා බැලීම්වලින් තොරව, අඛන්ඩව ක්‍රියාත්මක වන දැඩි නීති ක්‍රියාත්මක කිරීම් හා ප්‍රජා මැදිහත්වීම් මඟින් නීතිවිරෝධී මධ්‍යසාර නිෂ්පාදනය හා අලෙවිය තුරන් කිරීම සඳහා ප්‍රජා නායකත්වය සපයන ප්‍රාදේශීය ආගමික නායකයින් ඇතුළුව අනෙකුත් ප්‍රජා සේවකයින්ට නිසි ආරක්ෂාව සැපයිය යුතුය. එසේම නීති විරෝධී මධ්‍යසාර තුරන් කිරීම සඳහා ක්‍රියාත්මක වන ක්‍රියාකාරකම්වල ඵලදායීතාවය මැනීම සඳහා පැවරූ නඩු ගණන වෙනුවට නීති විරෝධී මධ්‍යසාරවල සුලභතාවය, භාවිතා කිරීම වැළැක්වීම යනාදී කරුණු කෙරෙහි වැඩි අවධානය යොමු විය යුතු බවද නිරීක්ෂණය කෙරේ.

### 3.4.5. පාරිසරික බලපෑම

දෙපාර්තමේන්තුවේ බලපත්‍රලත් නිෂ්පාදනාගාර 23 ක් අතරින් විගණනයේදී අවධානයට ලක්කල ස්කාගාර හා නිෂ්පාදනාගාර 6 ක් විසින් විගණනය සඳහා ඉදිරිපත් කර ඇති තොරතුරු අනුව 2018 හා 2019 වර්ෂ සඳහා එම නිෂ්පාදනාගාර විසින් මිලදී ගෙන ඇති බෝතල් ප්‍රමාණයේ එකතුව 46,254,703 ක් වූ අතර මෙම බෝතල් වලින් සියයට 90 ක පමණ ප්‍රමාණයක් නැවත භාවිතා කිරීමක් සිදු නොකර සෘජුවම පරිසරයට මුදාහැරීම මගින් ප්‍රධාන පාරිසරික ගැටළුවකට මුහුන දෙනු ලැබේ. ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් හෝ අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සලසාලීමට කටයුතු යෙදවීම පිළිබඳ අවධානය යොමුකිරීමට කැමැත්තෙමි. විස්තර පහත දැක්වේ.

| නිෂ්පාදනාගාරය | වර්ෂය | බෝතල් ප්‍රමාණය |
|---|---|---|
| රොක්ලන්ඩ් | 2018 | 5,959,260 |
| රෝයල් කාසල් | 2019 | 2,791,379 |
| රන්දෙනිගල | 2019 | 656,986 |

| | | |
|---|---|---|
| ඇක්මී | 2018<br>2019 | 25,251,530 |
| ක්ලැසික් | 2018<br>2019 | 923,468 |
| හිඟුරාන | 2018<br>2019 | 10,672,080 |

## 4. නිර්දේශ

ඉහත සඳහන් නිරීක්ෂණ සම්බන්ධයෙන් පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවධානය යොමු කරමි.

(i) 2019 ජුනි මස 20 දිනැති අංක 2128/30 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත අංක 4/2019 දරණ සුරාබදු නිවේදනය ප්‍රකාරව ස්ටිකර සහ ස්ටිකර කළමණාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතු විම. මෙම ස්ටිකර් කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ කාලය සුරාබදු නිවේදන 03 කින් දීර්ඝ කිරීමට කටයුතු කර ඇති හෙයින් තවදුරටත් දීර්ඝ නොකිරීම.

(ii) සුරාබදු දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව, සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව එකිනෙකට සම්බන්ධ වන පරිගණක දත්ත පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.

(iii) ස්ප්‍රීතු නියමිත ප්‍රමාණයට වඩා වැඩිපුර මෙරටට ගෙන්වා තිබීම සුරාබදු නිළධාරීන්ගේ අවධානයට ලක් වූ බවට සාක්ෂි ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් නිරීක්ෂණ ක්‍රියාවලිය විධිමත් කර ගැනීම සඳහා වරායෙහි සහ ගුවන්තොටුපොලෙහි සුරාබදු දෙපාර්තමේන්තුවේ කාර්යාල ස්ථාපිත කර අවශ්‍ය නිළධාරීන් සේවයේ යෙදවීමට ක්‍රියා කිරීම.

(iv) ස්ප්‍රීතු ලැබීම් පිළිබඳ තොරතුරු ප්‍රවාහන අවසර පත්‍රයේ සිට ලේගරගත කිරීම , නිෂ්පාදනය සඳහා නිකුත් කිරිම, මධ්‍යසාර නිෂ්පාදනය කිරිම පිළිබඳ ක්‍රියාදාමය පරිගණක පද්ධතියක් අනුසාරයෙන් සිදුකිරීම හා පූර්ණ අධීක්ෂණයකට ලක් කිරීම.

(v) අභ්‍යන්තර පාලනය ඉතා ඉහළ මට්ටමක ඇති නිෂ්පාදනාගාර දෙකකින් සුරාබදු ආදායමට සියයට 70 ක් සහ සියයට 10 ක ප්‍රතිශතයක් ලබාදී තිබූ අතර විගණනයට භාජනය කරන ලද අනෙක් ආයතන 4 හි දායකත්වය සියයට 3.54 සිට සියයට 0.36 දක්වා පහල අගයක් ගැනිමට එම ආයතනවල දූර්වල අභ්‍යන්තර පාලනය හේතුවී තිබුණි. එම නිසා අනෙකුත් නිෂ්පාදනාගාර සඳහා ද සඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වාදිමට කටයුතු කිරිම.

(vi) සුරාබදු අධිකාරි සහ සහකාර සුරාබදු කොමසාරිස් විසින් පරීක්ෂා කලයුතු වාර ගණන පරීක්ෂා කිරීම, හදිසි වැටලීම් සිදුකිරීම සහ ගිණුම් පොත්පත් පිළිබඳව අවධානය යොමුකිරීමට කටයුතු කිරීම.

(vii) ස්ප්‍රීතු භාවිතය මත්පැන් නිෂ්පාදනය සඳහා යොදා ගැනීම පිළිබඳව අවධානය යොමු කිරීම.

(viii) ඒ ඒ නිෂ්පාදනාගාර විසින් මිලදී ගනුලබන සහ භාවිතා කරනු ලබන ස්ප්‍රීතු තොගයත් , නිෂ්පාදනය සඳහා ස්ප්‍රීතු යෙදවීම , මධ්‍යසාර නිෂ්පාදනය සහ ඉතිරි තොග පිළිබඳ වාර්තා මාසිකව ප්‍රධාන කාර්යාලය වෙත ලබාගැනීම හා එම දත්ත පිළිබඳ විශ්ලේෂණය කිරීමක් සිදුකර ත්‍රෛමාසික වාර්තා භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂ ජනරාල්වෙත යොමුකරීමට අවශ්‍ය පියවර ගැනීම.

(ix) ස්ප්‍රීතු නිෂ්පාදනය කිරීම සඳහා රා සැපයුම් කිරීමේදී පොල් ඉඩම් ප්‍රමාණය අනුව අක්කරයකට තිබිය යුතු සම්මත පොල් ගස් ගණන පිළිබඳව සහ මදිනු ලබන පොල් ගස් සංඛ්‍යාව පිළිබඳව අවධානය යොමුකිරීම තුළින් රා ප්‍රවාහනය සඳහා අවසරපත්‍ර ලබාදීමට කටයුතු කිරීම. එමඟින් කෘතිම රා සැපයීම පාලනය කරීමට අවශ්‍ය පියවර ගැනීම.

(x) නියමිත කාලය තුල ප්‍රමාදයකින් තොරව විශ්ලේෂණ වාර්තා ලබාගැනීමට කටයුතු කිරීම.

(xi) සියළුම මධ්‍යසාර නිෂ්පාදන වර්ග අලෙවි කිරීම සඳහා බලපත්‍ර ලබාදීමේදී මහජනයාගේ සෞඛ්‍ය, ආරක්ෂාව හා මහජන මතය වැනි සාධක මත පදනම් වූ විනිවිදභාවයෙන් යුතු නව ක්‍රමවේදයක් සැකසීම.

(xii) දෙපාර්තමේන්තු නියෝග ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් දීම හා නියෝග උල්ලංගනය කර ඇති අවස්ථාවලදී සමථ ගාස්තු අයකිරීමට කටයුතු කිරීම.

(xiii) අපරාධ ඉලක්ක ලබාදීම පිළිබඳව අවධානය යොමු කිරීම.

(xiv) ලේබල්, මූඩි හා බෝතල් භාවිතය පිළිබඳව අවධානය යොමු කිරීම හා නිෂ්පාදනය සමඟ ලේබල් , මූඩි හා බෝතල් භාවිතය පිළිබඳව සහසම්බන්ධතාවය විශ්ලේෂණය කිරීම.

(xv) දෙපාර්තමේන්තුව තුල රසායනාගාරයක් පිහිටුවා ඒ හරහා විශ්ලේෂණ වාර්තා ලබාගැනීම හා අනෙකුත් කටයුතු සිදුකර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම.

(xvi) සෑම නිෂ්පාදනාගාරයක / ස්කාගාරයක ස්ථාපිත සුරාබදු කාර්යාල තුල සුරාබදු නියෝග, අණපනත් හා චක්‍රලේඛ සහ දෙපාර්තමේන්තු ශිල්පීය නියෝග ඇතුලත් ගොනුවක් පවත්වාගෙන යාමට සැලැස්වීම හා එම අණපනත් හා නියෝග පිළිබඳව අදාල නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කිරීම.

(xvii) මධ්‍යසාර සම්බන්ධව ජාතික ප්‍රතිපත්තියක් ඇති කිරීම.

(xviii) සුරාබදු ආදායම පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේදී මධ්‍යසාර භාවිතයෙන් සිදුවන අනිටු ප්‍රතිවිපාක හේතුවෙන් දැරීමට සිදුවන ඍජු හා වක්‍ර පිරිවැය පිළිබඳවද සැලකිල්ලට ලක් කිරීම.

(xix) පවත්නා නීති රීති යටතේ රාජ්‍ය ආදායම සුරක්ෂිත කලයුතුවීම.

රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීම සඳහා සහ මත්පැන් නිසා සිදුවන අනෙකුත් සමාජීය ප්‍රශ්න අවම කර ගැනීම සඳහා පවත්නා නීති මඟින් හඳුන්වා දී ඇති අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් පිළිබඳ අදාල ආයතනවල කාර්යමණ්ඩලය මෙන්ම සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ද තැකීමක් සිදු කර නොමැති බව මෙම වාර්තාවේ ඇතැම් නිරීක්ෂණවලින් පැහැදිලිවේ. එමෙන්ම එම කාර්යයන් වඩාත් විධිමත් කිරීමට හඳුන්වාදිය යුතු අභ්‍යන්තර පාලන පිළිවෙත් පිළිබඳව වගකිව යුතු පාර්ශවයන්ගේ අවධානය යොමු වී ඇති බවක්ද නිරීක්ෂණය නොවේ. තත්ත්වය එසේ තිබියදී තෝරාගත් මෙම ආයතනවල සේවයේ යෙදීමට නිලධාරීන් දක්වන ඉහල අභිරුචිය පිළිබඳ විශේෂ අවධානය යොමුකර ඒ සඳහා අවශ්‍ය කඩිනම් පියවර ගතයුතු වේ.


ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති
2021 ජනවාරි 21 දින

**ගාස්තු තීරණය කිරීමේදී මිල උච්චාවචනයන් පිළිබඳ සැලකිලිමත් නොවූ අවස්ථා**

| බලපත්‍රයේ ස්වභාවය | **2008 අංක 902 දරන සුරාබදු නිවේදනය ප්‍රකාරව** | | **2015 අංක 983 දරන සුරාබදු නිවේදනය ප්‍රකාරව** | | **2017 අංක 1004 දරන සුරාබදු නිවේදනය ප්‍රකාරව** | |
|---|---|---|---|---|---|---|
| | **වාර්ෂික බලපත්‍ර ගාස්තුව** | **ඇපය** | **වාර්ෂික බලපත්‍ර ගාස්තුව** | **ඇපය** | **වාර්ෂික බලපත්‍ර ගාස්තුව** | **ඇපය** |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| අරක්කු, ධාන්‍ය මත්පැන් හා විදේශීය මත්පැන් තොග විකිණීම සඳහා බෙදා හැරීම | 75,000 | 50,000 | 1,000,000 | 50,000 | 1,000,000 | 50,000 |
| මත්පැන් සඳහා තොග වෙළඳ බලපත්‍රය. | 375,000 | 50,000 | 1,000,000 | 50,000 | 1,000,000 | 50,000 |
| **මත්පැන් සඳහා සිල්ලර බලපත්‍ර** | | | | | | |
| මහනගර සභා ප්‍රදේශ | 225,000 | 25,000 | 600,000 | 25,000 | 600,000 | 25,000 |
| නගර සභා ප්‍රදේශ | 150,000 | 25,000 | 400,000 | 25,000 | 400,000 | 25,000 |
| අනෙකුත් ප්‍රදේශ | 125,000 | 25,000 | 300,000 | 25,000 | 300,000 | 25,000 |
| සමාගමේ පිරිවැටුම දස ලක්ෂ 72 ඉක්ම වන්නේනම් | 300,000 | 25,000 | 1,000,000 | 25,000 | 1,000,000 | 25,000 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **හෝටල් බලපත්‍ර** | | | | | | |
| කාමර 200 ක් හෝ ඊට වැඩි | 300,000 | 5,000 | 1,000,000 | 25,000 | 500,000 | 25,000 |
| කාමර 20 සිට 199 දක්වා | - | - | 500,000 | 25,000 | 250,000 | 25,000 |
| කාමර 20 ට අඩු | 100,000 | 5,000 | 300,000 | 25,000 | 100,000 | 25,000 |
| **භෝජනාගාර බලපත්‍ර සංචාරක මණ්ඩලය අනුමැතිය සහිත** | | | | | | |
| ඒ ශ්‍රේණිය | 200,000 | 5,000 | 600,000 | 25,000 | 250,000 | 25,000 |
| බී ශ්‍රේණිය | 150,000 | 5,000 | 600,000 | 25,000 | 250,000 | 25,000 |
| සී ශ්‍රේණිය | 100,000 | 5,000 | 600,000 | 25,000 | 250,000 | 25,000 |
| සංචාරක මණ්ඩලයේ අනුමැතිය රහිත | 100,000 | 25,000 | 600,000 | 25,000 | 250,000 | 25,000 |
| හිමිකාර සමාජ ශාලා | 300,000 | 25,000 | 800,000 | 25,000 | 500,000 | 25,000 |
| **සාමාජිකයින් පමණක් වන සමාජශාලා** | | | | | | |
| මහ නගර සභා ප්‍රදේශ | 75,000 | 25,000 | 600,000 | 25,000 | 250,000 | 25,000 |
| නගර සභා ප්‍රදේශ | 50,000 | 25,000 | 600,000 | 25,000 | 250,000 | 25,000 |
| වෙනත් ප්‍රදේශ | 25,000 | 25,000 | 600,000 | 25,000 | 250,000 | 25,000 |
| සිනමා සඳහා විනෝද පීඩිකා බලපත්‍ර | 75,000 | 25,000 | 300,000 | 25,000 | 50,000 | 25,000 |
| වතු කැන්ටින් රා | 10,000 | 10,000 | 100,000 | 25,000 | 25,000 | 25,000 |
| අරක්කු හා රා | 20,000 | 10,000 | 100,000 | 25,000 | 25,000 | 25,000 |
| දුම්රිය භෝජනාගාර | 25,000 | 25,000 | 50,000 | 25,000 | 25,000 | 25,000 |
| අවස්ථා බලපත්‍රය | 5,000 | - | 50,000 | - | 25,000 | - |

ඇමුණුම 02



සුරාබදු කොමසාරිස් ජනරාල්
අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම් ප්‍රතිපත්ති හා පරිපාලන) (ශ්‍රී.ලං.ප.සේ)
අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම් මෙහෙයුම් හා නීති ක්‍රියාත්මක කිරීම්) (දෙපාර්තමේන්තුගත)
සුරාබදු කොමසාරිස් (පාලන/මානව සම්පත්) ශ්‍රී.ලං.ප.සේ
සුරාබදු කොමසාරිස් (සමාජ ආරක්ෂණ සහ සංවර්ධන) දෙපාර්තමේන්තුගත
ප්‍රධාන ගණකාධිකාරී (ශ්‍රී.ලං.ග.සේ)
ප්‍රධාන අභ්‍යන්තර විගණක (ශ්‍රී.ලං.ග.සේ)
සුරාබදු කොමසාරිස් (ආදායම් හා මෙහෙයුම්) දෙපාර්තමේන්තුගත
සුරාබදු කොමසාරිස් (නීති ක්‍රියාත්මක කිරීම්) දෙපාර්තමේන්තුගත
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (පාලන) ශ්‍රී.ලං.ප.සේ
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (මානව/සම්පත්) දෙපාර්තමේන්තුගත
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (යෙදවුම්) දෙපාර්තමේන්තුගත
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (අධ්‍යයන හා පර්යේෂණ) දෙපාර්තමේන්තුගත
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (සමාජ ආරක්ෂණ) දෙපාර්තමේන්තුගත
ගණකාධිකාරී (ගෙවීම්) (ශ්‍රී.ලං.ග.සේ)
ගණකාධිකාරී (ආදායම්) (ශ්‍රී.ලං.ග.සේ)
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (නීති) දෙපාර්තමේන්තුගත
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (ආදායම් මලපත්‍ර) දෙපාර්තමේන්තුගත
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (SCR & ICT) දෙපාර්තමේන්තුගත
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (නීති ක්‍රියාත්මක කිරීම්) දෙපාර්තමේන්තුගත
සහකාර සුරාබදු කොමසාරිස්
සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)
සුරාබදු අධිකාරී
සංඛ්‍යා ලේඛනඥ
පරිපාලන නිලධාරී
භාෂා පරිවර්තක
ප්‍රධාන සුරාබදු පරීක්ෂක
සුරාබදු පරීක්ෂක
සංඛ්‍යා ලේඛන නිලධාරී
තොර. හා සන්නි. තාක්ෂණ නිලධාරී
සුරාබදු සැරයන් මේජර්
සුරාබදු සැරයන්
කාර්මික නිලධාරී
ප්‍රවාහන නිලධාරී
සංවර්ධන නිලධාරී
තොර. හා සන්නි. තාක්ෂණ සහකාර
සුරාබදු නියාමක/කොපුල්
රාජ්‍ය කළමනා. සහකාර
කාර්යාල කාර්ය සහයක
රියදුරු සුරාබදු රියදුරු
බංගලා භාරකරු

# මධ්‍යසාර නිෂ්පාදන සමාගම් වලින් ආදායමට ඇති දායකත්වය

| නිෂ්පාදනාගාරය | 2018 වර්ෂය | | මුළු ආදායමෙන් ප්‍රතිශතය |
|---|---|---|---|
| | නිෂ්පාදනය | ආදායම | |
| | සම්මත සැර | රු.මිලියන | |
| DCSL | 29,617,060.92 | 55,737 | 66.97 |
| Higurana | 948,851.17 | 1,785 | 2.15 |
| IDL | 4,330,790.23 | 8,150 | 9.79 |
| Rocland Distilleries | 3,103,825.76 | 5,841 | 7.02 |
| Nippon Expo | 226,159.65 | 425 | 0.51 |
| Periceyl Co. | 1,700,745.42 | 3,200 | 3.85 |
| Acme (PVT) ltd. | 1,564,739.37 | 2,944 | 3.54 |
| W.M. Mendis | 995,905.99 | 1,874 | 2.25 |
| V.A. Distilleries | 722,488.30 | 1,359 | 1.63 |
| Scotland | 239,379.71 | 450 | 0.54 |
| Uva Glen | 221,461.76 | 416 | 0.50 |
| Randenigula | 123,781.32 | 232 | 0.28 |
| Royal Cask | 161,079.02 | 303 | 0.36 |
| Thikkam | 13,686.37 | 25 | 0.03 |
| Valikamam | 43,973.69 | 82 | 0.10 |
| Warani | 14,588.03 | 27 | 0.03 |
| Manori Lanka | 56,418.80 | 106 | 0.13 |
| Classic | 58,059.25 | 109 | 0.13 |

ඇමුණුම - 04

**ලබා ගත් නිදර්ශක ප්‍රමාද වී රස පරීක්ෂක වෙත යොමු කිරීම.**

| ස්කාගාරය/ නිෂ්පාදනාගාරය | නිදර්ශක ලබාගත් දිනය | රසපරීක්ෂක වෙත යොමු කල දිනය |
|---|---|---|
| රොක්ලන්ඩ් නිෂ්පාදනාගාරය තිත්තපත්තර | 2018 මාර්තු 07 සිට අප්‍රේල් 19 | 2018.04.24 |
| | 2019 ජුනි 27 | 2018.07.10 |
| | 2019 ජුලි 03 | 2019.07.23 |
| | 2019 ජුලි 05 සිට 11 දක්වා | 2019.07.23 |
| | 2019 අගෝස්තු | 2019.09.06 |
| ඇක්මී ස්කාගාරය දුම්මලසූරිය. | ML/1694/19 | 2019.09.17 |
| | 2019/07/19 | |
| | 2019/07/18 (11/2019 , 12/2019, 13/2019) | 2019.09.17 |
| | DD/S/27/2019 (2019/05/10) | 2019.06.07 |
| | 2019/05/17 ලබාගත් සාම්පල් 6 ක් | 2019.06.07 |
| | 2019.07.22 සිට 2019.10.03 දක්වා කාලය තුල ලබාගත් සාම්පල් 23 ක් 2019.10.16 දින වන විටත් රස පරීක්ෂක වෙතයවා නොතිබුණි. | |

**ලේබලයේ සඳහන් සැර ප්‍රමාණය සහ රසපරීක්ෂක වාර්තා වල සඳහන් සැර වෙනස්වීම් වාර්තා වු අවස්ථාව.**

| ස්කාගාරය/ නිෂ්පාදනාගාරය | සාම්පල් අංකය | ලේබලයේ සඳහන් සැර | රස පරීක්ෂක වාර්තාවේ සැර |
|---|---|---|---|
| ඇක්මී ස්කාගාරය | ML/719/18 | 74 | 73.7 |
| | DD/S/03/2018 | 74 | 73.7 |
| | DD/S/02/2018 | 74 | 73.7 |
| | DD/S/27/2019 | 74 | 73.7 |
| | සැපයුම් කරුගේ බලපත්‍ර අංකය | දෛනික ලැබීම් ලේඛනය අනුව | |
| | 24/19 | 7 | 7.1 |
| | 25/19, 26/19 | 7 | 7.3 |
| | 01/19 | 7.2 | 7.4 |
| | 29/19 | 7 | 7.3 |
| | 24/2019 | 7.1 | 6.8 |
| | 25/2019 | 7.1 | 7.3 |
| | 26/2019 | 7.1 | 6.8 |
| | 19/2018 | 7.1 | 6.8 |
| රොක්ලන්ඩ් නිෂ්පාදනාගාරය තිත්තපත්තර | ML/1886/18 | 33.5 | 33.1 |
| රොක්ලන්ඩ් ස්කාගාරය මාරවිල | සැපයුම්කරුගේ නම | | |
| | G.S.W.K. දිසානායක | 7.4 | 7.1 |
| | W.N.J. රුද්‍රිගෝ | 7.5 | 8.1 |

| | | | |
|---|---|---|---|
| | K.P.A.A ප්‍රනාන්දු | 7.5 | 8.4 |
| | විමලසේන මාරසිංහ | 7.5 | 8.3 |
| | W.A.N.ප්‍රනාන්දු | 7.5 | 5.9 |
| | W.N.J. රුද්‍රිගෝ | 6.6 | 5.3 |
| | රොක්ලන්ඩ් ඩිස්ට්ලරීස් සමාගම | 6.5 | 7 |
| | රොක්ලන්ඩ් ඩිස්ට්ලරීස් සමාගම | 6.5 | 8.1 |
| | W.A.N. ප්‍රනාන්දු | 7 | 6.6 |
| හිඟුරාන ඩිස්ට්ලරීස් | අතිවිශේෂ අරක්කු | 33.5 | 33.8 |
| තිත්තපත්තර | විශේෂ අරක්කු | 30.5 | 30.8 |
| | රෙඩ් අරක්කු | 27.5 | 27.8 |
| රොක්ලන්ඩ් | RD/T/01/2018 | 17% ක් වතුර අන්තර්ගත වීම | |
| ස්කාගාරය මාරවිල | RD/T/02/2018 | අනුමත සීමාව ඉක්මවා අම්ල පැවතීම | |
| | RD/T/30/2017 | අනුමත සීමාව ඉක්මවා අම්ල පැවතීම | |
| | RD/T/34/2017 | අනුමත සීමාව ඉක්මවා අම්ල පැවතීම | |
| අයි.ඩී.එල් | L/1083/2019 | 37.7 | 37.3 |
| | L/1086/2019 | 40 | 39.4 |
| | L/1088/2019 | 40 | 39.6 |
| | L/1091/2019 | 40 | 39.4 |
| | L/6706-6728/19 | 37.7 | 37.2 |
| | L/6706-6728/19 | 37.7 | 36.9 |
| | L/6516-6534/19 | 28 | 28.3 |
| | L/6516-6534/19 | 37.7 | 37 |
| | L/6516-6534/19 | 40 | 40.3 |
| | L/6516-6534/19 | 40 | 39.5 |
| | L/2960-2971/19 | 40 | 40.4 |
| | L/2960-2971/19 | 33.5 | 33.8 |
| | L/4508-4516/19 | 40 | 40.3 |

| | | | |
|---|---|---|---|
| | L/1304/19 | 37.7 | 38.1 |
| | L/1306/2019 | 30 | 29.7 |
| | L/2321-2341/20 | 40 | 40.5 |
| | L/2321-2341/20 | 40 | 40.6 |
| | L/2321-2341/20 | 40 | 40.4 |
| රෝයල් කාස්ක් ඩිස්ටිලරීස් | | | |
| | ML 538 | 12.5 | 11.4 |
| | ML 537 | 12.5 | 11.4 |
| | ML 89 | 27.5 | 27.8 |
| | ML/2008 | 12.5 | 11.2 |
| | ML 1789 | 30.5 | 29.9 |
| | ML 1790 | 30.5 | 29.9 |
| | ML 1791 | 30.5 | 29.7 |
| | ML 1792 | 30.5 | 29.7 |
| | ML 1793 | 33.5 | 32.7 |
| | ML /890 | 12.5 | 11.3 |
| | ML 887 | 30.5 | 30.0 |
| | ML 889 | 30.5 | 29.9 |
| | ML 209/19 | 30.5 | 30.1 |
| | ML 210/19 | 30.5 | 30.1 |
| | ML 2744/18 | 30.5 | 30.1 |
| ඩී.සී.එස්.එල්. නව ගුදම | 429 | 33.5 | 33.8 |
| | 430 | 33.5 | 33.8 |
| | 431 | 33.5 | 33.8 |
| | 432 | 33.5 | 33.9 |
| | 433 | 33.5 | 33.9 |

| | | | |
|---|---|---|---|
| | 1776 | 33.5 | 33.8 |
| | 1546/18 | 27.5 | 28.2 |
| | 1548/18 | 33.5 | 33.8 |
| | 1549/18 | 33.5 | 33.8 |
| | 1550/18 | 33.5 | 33.9 |
| | 1551/18 | 27.5 | 28.0 |
| | 1552/18 | 33.5 | 33.8 |
| | 1553/18 | 33.5 | 33.9 |
| | 1554/18 | 33.5 | 33.8 |
| | 1555/18 | 33.5 | 33.8 |
| රොයල් කාස්ක් ස්කාගාරය | ML435 | 96.1 | 96.3 |
| | ML436 | 96.2 | 94.8 |

## ප්‍රවාහන අවසර පත්‍රය හා ඞී 33 ලේඛණය සමග අනුකූල නොවූ අවස්ථා

| ප්‍රවාහන අවසර පත්‍ර අංකය | අවසර පත්‍රයේ තොරතුරු අනුව | | | ඞී - 33 ලේඛනය අනුව | | |
|---|---|---|---|---|---|---|
| | තොග ලීටර | සැර | නිරපේක්ෂ මධ්‍යසාර ලීටර | තොග ලීටර | සැර | නිරපේක්ෂ මධ්‍යසාර ලීටර |
| D273026 2/25 | 5000 | 96.1 | 4805.0 | 2502.8 | 96.2 | 2407.7 |
| D273026 2/26 | 5000 | 96.1 | 4805.0 | 2000.0 | 96.2 | 1924.0 |
| D273029 2/28 | 5000 | 96.1 | 4805.0 | 10000.0 | 96.1 | 9610.0 |
| D273031 3/05 | 5000 | 96.1 | 4805.0 | 2498.6 | 96.1 | 2401.2 |
| D273042 4/05 | 3750 | 96.2 | 3607.5 | 4998.0 | 96.1 | 4803.1 |
| D273056 5/22 | 10000 | 96.1 | 9610.0 | 1502.8 | 96.1 | 1444.2 |
| D273070 7/31 | 10000 | 96.1 | 9610.0 | 4999.0 | 96.1 | 4804.0 |
| D273071 8/09 | 10000 | 96.1 | 9610.0 | 3750.4 | 96.1 | 3604.1 |
| D273072 8/13 | 10000 | 96.1 | 9610.0 | 4250.4 | 96.1 | 4084.6 |
| D273082 8/18 | 10000 | 96.2 | 9620.0 | 999.0 | 96.2 | 961.0 |
| D273083 9/19 | 8750 | 96.2 | 8417.5 | 3999.0 | 96.2 | 3847.0 |
| D273089 10/04 | 10000 | 96.2 | 9620.0 | 3996.8 | 96.2 | 3844.9 |
| D273090 10/09 | 10000 | 96.2 | 9620.0 | 2502.9 | 96.2 | 2407.8 |

**යම්කිසි මාසයක අවසන් ශේෂය ඊළග මාසයේ ආරම්භක ශේෂය සමඟ නොගැලපීම.**

| නිෂ්පාදනාගාර/ස්කාගාර | වර්ෂය හා මාසය | | නිවැරදි ආරම්භක ශේෂය | සටහන් කර ඇති ශේෂය | වෙනස |
|---|---|---|---|---|---|
| -------------------------- | ---------------------- | | ----------------- | ------------ | -------- |
| | | | තොග ලීටර | තොග ලීටර | තොග ලීටර |
| ඇක්මී ස්කාගාරය | 2019 | මැයි | 64,225.7 | 67,227.7 | 3002.0 |
| | | ජුනි | 64,365.5 | 61,365.5 | 3000.0 |
| රොක්ලන්ඩ් ස්කාගාරය මාරවිල | 2018 | අප්‍රේල් | 144,801.6 | 139,763.8 | 5037.8 |
| | | මැයි | 164,522.8 | 130,472.3 | 34050.5 |
| | | ජුනි | 143,184.0 | 144,125.0 | 541.0 |
| | | ජූලි | 146,025.8 | 130,344.2 | 15676.0 |
| | | අගෝස්තු | 122,746.4 | 123,685.8 | 939.4 |
| | | | සං.ම. ලීටර් | සං.ම.ලීටර | සං.ම.ලීටර |
| හිඟුරාන ස්කාගාරය. | 2018 | | 268,872.7 | 250,538.1 | 18334.6 |
| | 2019 | | 285,645.2 | 283,200.3 | 2444.9 |
| | 2019 | සැප්තැම්බර් | 370,764.8 | 317,127.1 | 53637.79 |
| V.A. ඩිස්ටිලරීස් පුද්. සමාගම | 2017 | මැයි | 71,069.1 | 69,286.8 | 1782.3 |
| | 2019 | පෙබරවාරි | 132,343.10 | 129,429.4 | 2913.7 |
| රෝයල් කාස්ක් ඩිස්ටිලරීස් | 2017 | දෙසැම්බර් | 2158.4 | 1197.4 | 961.0 |
| | 2018 | ජනවාරි | 1850.2 | 1480.4 | 369.8 |
| | 2018 | සැප්තැම්බර් | 7815.6 | 7509.0 | 306.6 |
| | 2019 | නොවැම්බර් | 19907.9 | 7555.6 | 12,352.3 |

**ලේගර අතර ස්ප්‍රීතු මාරුකිරීම් අසමාන වූ අවස්ථා.**

| නිෂ්පාදනාගාරය | වර්ෂය හා මාසය | මාරුකිරීම සඳහා නිකුත් කල ස්ප්‍රීතු | ලැබුනු ස්ප්‍රීතු ප්‍රමාණය | වෙනස |
|---|---|---|---|---|
| | | සං.ම.ලීටර | සං.ම. ලීටර | සං.ම. ලීටර |
| ඇක්මී නිෂ්පාදනාගාරය | 2018ජනවාරි | 122,791.9 | 102,254.7 | 20537.2 |
| | පෙබරවාරි | 94,323.9 | 99,327.1 | 5003.2 |
| | මාර්තු | 133,389.3 | 127,761.1 | 5628.2 |
| | අප්‍රේල් | 136,096.2 | 155,111.6 | 19015.4 |
| | 2019ජනවාරි | 119,111.3 | 126,955.6 | 7844.3 |
| | අප්‍රේල් | 121,683.6 | 140,923.6 | 19240.0 |
| | අගෝස්තු | 90,037.6 | 109,355.3 | 19317.7 |
| හිඟුරාන නිෂ්පාදනාගාරය | 2017මාර්තු | 55,457.6 | 59,864.3 | 4406.7 |
| | අප්‍රේල් | 46,613.3 | 46,655.3 | 42.0 |
| | නොවැම්බර් | 28,366.9 | 30,580.1 | 2213.2 |
| | 2018 අප්‍රේල් | 14,412.4 | 13,992.3 | 420.1 |
| | ජුනි | 13,835.6 | 12,740.6 | 1095.0 |
| V.A. ඩිස්ටිලරීස් පුද්. සමාගම | 2019ජනවාරි | 79,204.4 | 93,418.2 | 14213.8 |
| | පෙබරවාරි | 26,671.5 | 25,232.10 | 1439.4 |
| | මාර්තු | 33,291.8 | 30,080.10 | 3211.7 |
| | මැයි | 29,360.6 | 27,659.90 | 1700.7 |
| | ජුනි | 51,749.10 | 51,636.20 | 112.9 |
| | ජූලි | 42,550.10 | 39,983.80 | 2566.3 |
| රෝයල් කාස්ක් ඩිස්ටිලරීස් | 2018 ජනවාරි | 480.5 | 580.3 | 99.8 |
| | අප්‍රේල් | 12,124.9 | 21,554.8 | 9,429.9 |

| | | | |
|---|---|---|---|
| ජූලි | 12,230.6 | 11,510.4 | 720.2 |
| අගෝස්තු | 14,883.1 | 15,189.7 | 306.6 |
| නොවැම්බර් | 16,113.6 | 14,062.3 | 2,050.7 |
| දෙසැම්බර් | 8,763.9 | 13,806.2 | 5,042.3 |
| 2019- ජූලි | 7,890.3 | 19,738.9 | 11,848.6 |

ඇමුණුම - 09

**නිෂ්පාදනාගාර සඳහා ලැබෙන හා නිෂ්පාදනය සඳහා නිකුත් කරනු ලබන ස්ප්‍රීතු පිළිබඳ ඞී - 8 හා ඞී - 9 ලේඛන අතර නොගැලපීම්.**

| නිෂ්පාදනාගාරය | වර්ෂය හා මාසය | | ඞී - 8 ලේඛනය අනුව | ඞී - 9 ලේඛනය අනුව | වෙනස |
|---|---|---|---|---|---|
| | | | සං.ම.ලි | සං.ම.ලි | සං.ම.ලි |
| හිඟුරාන නිෂ්පාදනාගාරය | 2018 | ජූනි | 25,400.0 | 26,495.3 | 2018 |
| | | අගෝස්තු | 74,741.0 | 79,551.0 | |
| | | සැප්තැම්බර් | 42,831.5 | 42,731.5 | |
| | 2019 | ජනවාරි | 38,597.4 | 35,528.0 | 2019 |
| <u>නිකුත් කිරීම්</u> | | | | | |
| | 2018 | ජනවාරි | 42,927.3 | 817.2 | |
| | | අප්‍රේල් | 50,048.3 | 418.4 | |
| | | අගෝස්තු | 47,095.5 | 47,895.5 | 800.0 |
| | | සැප්තැම්බර් | 45,123.4 | 45,118.3 | 5.1 |
| | | දෙසැම්බර් | 49,123.4 | 48,101.0 | 1758.4 |
| | 2019 | ජනවාරි | 49,859.4 | 45,911.5 | 3069.4 |
| | | | **සම්මත සැර ලී.** | **සම්මත සැර ලී.** | **සම්මත සැර ලී.** |
| ඇක්මී ස්කාගාරය | 2019 | පෙබරවාරි | 14,051.11 | 13,051.1 | 1,000.01 |

| V.A. ඩිස්ටිලරීස් පුද්. සමාගම | | | සංශුද්ධ මධ්‍යසාර ලීටර | සංශුද්ධ මධ්‍යසාර ලීටර | සංශුද්ධ මධ්‍යසාර ලීටර |
|---|---|---|---|---|---|
| | 2018 | ජනවාරි | 56,950.9 | 57,050.7 | 99.8 |
| | | අප්‍රේල් | 111,354.8 | 112,303.1 | 948.3 |
| | 2019 | ජනවාරි | 75,916.4 | 76,809.6 | 893.2 |
| | | පෙබරවාරි | 131,331.4 | 129,437.4 | 1,902.0 |
| | | මාර්තු | 142,424.7 | 136,437.6 | 5,987.1 |
| | | අප්‍රේල් | 120,913.4 | 116,352.2 | 4,561.2 |
| | | මැයි | 110,587.7 | 111,338.1 | 750.4 |
| | | ජුනි | 163,355.5 | 164,147.5 | 792.0 |
| | | අගෝස්තු | 103,809.2 | 104,599.3 | 790.1 |
| | | සැප්තැම්බර් | 103,017.9 | 103,776.3 | 758.4 |
| රෝයල් කාස්ක් ඩිස්ටිලරීස් | 2019 | ජුලි | 20,718 | 37,566 | |
| | | දෙසැම්බර් | 19,036.3 | 10,570.9 | |
| අයි.ඩී.එල්. | 2019 ස්ප්‍රීතු ලැබීම | ජනවාරි | - | 193,076.0 | 193,076.0 |
| | | පෙබරවාරි | - | 24,140.0 | 24,140.0 |
| | | මාර්තු | 130,703.6 | 214,338.7 | 83,635.1 |
| | | අප්‍රේල් | 302,430.3 | 326,471.3 | 24,041.0 |
| | 2019 ස්ප්‍රීතු නිකුත් කිරීම | ජනවාරි | 196,340.5 | 209,000.7 | 12,660.2 |
| | | මාර්තු | 276,090.1 | 288,476.1 | 12,386.0 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | අප්‍රේල් | 179,514.5 | 202,290.7 | 22,776.2 |
| D.C.S.L පැරණි ගුදම | 2020 නිකුත් කිරීම් | ජනවාරි | 227,626.8 | 271,322.4 | 43,695.6 |
| | | පෙබරවාරි | 217,533.0 | 260,358.0 | 42,825.0 |
| | | මාර්තු | 107,885.2 | 116,671.6 | 8,792.4 |
| | | මැයි | 155,962.0 | 164,033.4 | 8,071.4 |

## ඩී - 33 හා ඩී - 9 ලේඛන අනුව ස්ප්‍රීතු ලැබීම් නොගැලපුනු අවස්ථා.

| නිෂ්පාදනාගාරය | වර්ෂය හා මාසය | | ඩී - 33 අනුව | ඩී - 9 අනුව | වෙනස |
|---|---|---|---|---|---|
| ------------------- | ------------------ | | --------------- | ------------- | ---------- |
| | | | සංශුද්ධ මධ්‍යසාර ලීටර | සංශුද්ධ මධ්‍යසාර ලීටර | සංශුද්ධ මධ්‍යසාර ලීටර |
| හිඟුරාන නිෂ්පාදනාගාරය | 2018 | ජනවාරි | 30,882.2 | 32,479.5 | 1599.3 |
| | | පෙබරවාරි | 41,516.0 | 43,246.0 | 1730.0 |
| | | අප්‍රේල් | 90,635.50 | 94,264.5 | 3629.0 |
| | | මැයි | 22,828.70 | 28,588.7 | 5760.0 |
| | | ජූනි | 25,400.9 | 26,495.3 | 1094.4 |
| | | අගෝස්තු | 78,441.0 | 79,551.0 | 1110.0 |
| | 2017 | මාර්තු | 50,579.6 | 46,128.0 | 4451.6 |
| | | ඔක්තෝබර් | 42,646.9 | 44,811.6 | 2164.7 |
| V.A. ඩිස්ටිලරීස් පුද්. සමාගම | 2019 | ජනවාරි | 92,282.95 | 78,072.8 | 14,210.15 |
| | | පෙබරවාරි | 34,359.35 | 34,123.3 | 236.05 |
| | | මාර්තු | 21,612.1 | 24,834.6 | 13,222.5 |
| | | මැයි | 92,300.8 | 94,016.4 | 1,715.6 |
| | | අගෝස්තු | 37,222.8 | 40,842.8 | 3,620.0 |
| I.D.L | 2019 | මාර්තු | 214,388.3 | 214,338.3 | 50 |
| | | ජූනි | 59935.7 | 59,952.7 | 17 |
| | | සැප්තැම්බර් | 118,143.7 | 118,288.6 | 1449 |
| | | ඔක්තොබර් | 297,448.1 | 298,456.2 | 1008.1 |
| | | දෙසැම්බර් | 233,905.6 | 233,870.6 | 35 |